ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
இலங்கை உயர் தொழில்நுட்பவியல் கல்வி நிறுவகம்
Sri Lanka Institute of Advanced Technological Education



වාර්ෂික වාර්තාව
ANNUAL REPORT
ஆண்டறிக்கை

2020

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

දැක්ම

"ශ්‍රී ලංකාවේ
තාක්ෂණික අධ්‍යාපනයේ
විශිෂ්ඨතම මධ්‍යස්ථානය
බවට පත් කිරීම"

" තිරසාර සංවර්ධනය සඳහා
නවීන තාක්ෂණයෙන් හෙබි
උසස් ජාතික ඩිප්ලෝමාධාරීන්
බිහි කිරීම "

මෙහෙවර

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් 2020 වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩය බෙදා ගැනීමට ලැබීම සතුටට කරුණකි. සැබවින් ම, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් 2020 අපට අභියෝගාත්මක වසරක් විය. නමුත් ශ්‍රී ලං. උ. තා. අ. ආ. විසින් පිරිනමනු ලබන පාඨමාලාවේ ගුණාත්මකභාවය පවත්වා ගැනීමට අපට හැකි වූ අතර අපගේ නව ඉලක්කය සමඟ ඉදිරියට යාමට අපට හැකි විය. ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ යන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ශ්‍රී ලං. උ. තා. අ. ආ. උපාධිය ප්‍රදානය කිරීමේ තත්ත්වයට උසස් කිරීමට විශේෂයෙන් පියවර ගන්නා ලදී. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලං. උ. තා. අ. ආ. පනත සංශෝධනය කිරීමට අමාත්‍යාංශය අප හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සමඟ රැස්වීම් ගණනාවක් සංවිධානය කරන ලදී. මෙය ශ්‍රී ලං. උ. තා. අ. ආ. ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයකි. 2021 දී මෙම උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සියලුම උසස් අධ්‍යාපන ආයතන 2020 මාර්තු මාසයේ සිට වසා දැමීමට රජය ගත් තීරණයත් සමඟ සිසුන්ට කෝවිඩ් - 19 පැතිරීම වැළැක්වීම සඳහා සියලුම උ. තා. ආ. වසා දමන ලදී. මෙම කාලය තුළ අධ්‍යයන කටයුතු සඳහා වන බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් හොඳින් සැලසුම් කරන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් මාර්ගගත ක්‍රමයට දේශන පවත්වන ලද අතර එය ශ්‍රී ලං. උ. තා. අ. ආ. අධ්‍යයන කාර්ය මණ්ඩලයට නව අත්දැකීමක් විය. ඔවුන් දේශන ඵලදායී ලෙස පැවැත්වූ අතර සිසුන්ගේ සහභාගිත්වය ද සෑහීමකට පත්විය හැකි මට්ටමක පැවතුණි. 2020 මැයි මාසයේ දී, උ. තා. ආ.නැවත විවෘත කිරීමෙන් අනතුරු ව පන්ති කාමර තුල විභාග පැවැත්වීමට ශ්‍රී ලං. උ. තා. අ. ආ.ට හැකි විය.

2020 දී කොවිඩ් -19 බරපතල තර්ජනයක් වූව ද, ශ්‍රී ලං. උ. තා. අ. ආ. විසින් ගාල්ල උ. තා. ආ.,කෑගල්ල උ. තා. ආ., කුරුණෑගල උ. තා. ආ. සහ මහනුවර උ. තා. ආ. සඳහා ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීමේ කටයුතු සාර්ථක ව නිම කරන ලදී. මෙම සියලු නව ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම සාදා නිම කර ඇත. මීට අමතර ව, මෙම උ. තා. ආ. හි ඉගැන්වීම් හා ඉගෙනුම් පරිසරයට පහසුකම් සැලසීම සඳහා උ. තා. ආ. සඳහා ගෘහ භාණ්ඩ වහාම මිලදී ගන්නා ලදී.

ශ්‍රී ලං. උ. තා. අ. ආ. සියලු පාඨමාලාවල විෂයමාලා සංශෝධනය කරමින් සිටින අතර ඒ අනුව 2020 දී උ. ජා. සං. ස. ක. ඩි. සහ උ. ජා. ක. ඩි. වැඩසටහන්වල විෂයමාලා සංශෝධනය උපදේශකයින්ගේ මග පෙන්වීම මත අවසන් කරන ලදී.

පවත්නා වැඩසටහන්වල නිරන්තර ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකයක්, තත්ත්ව සහතික කිරීමේ ඒකකයක් සහ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලං. උ. තා. අ. ආ.හි විශාල අවශ්‍යතාවයක් තිබුණි. මේ සඳහා 2020 දී මූලික පියවර ගන්නා ලදී.

2020 උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මත පදනම් ව, ආරක්ෂක සේවා අධීක්ෂණය හා සංවර්ධනය කිරීම සඳහා සංවෘත පරිපථ රූපවාහිනී නිරීක්ෂණ පද්ධති උ. තා. ආ. 12ක සහ ශ්‍රී

ලං. උ. තා. අ. ආ. හි ස්ථාපනය කරන ලදී. සියලු ම උ. තා. ආ. අතර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ශ්‍රී ලං. උ. තා. අ. ආ. සෑම විටම මග සලසයි. සියලු ම උ. තා. ආ. දිවයින පුරා රැස්වීම් පැවැත්වීමේ තවත් නව ක්‍රමයක් කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් හඳුනාගෙන ඇත. එය උ. තා. ආ. 19කට සහ ශ්‍රී ලං. උ. තා. අ. ආ. ට භෞතිකමය වශයෙන් එක්රැස් නොවී, රැස්වීම් සහ අනෙකුත් කාර්යයන් සඳහා පහසුකම් සපයන වීඩියෝ සම්මන්ත්‍රණ ඒකක වේ. ඇත්ත වශයෙන්ම, මෙය මාසික රැස්වීම් පැවැත්වීමට ඉතා ඵලදායී හා සාර්ථක ක්‍රමයක් වන අතර එය දුර බැහැර සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඉතා පහසු විය. ලැබෙන සහ යවන දත්ත නිරීක්ෂණය කිරීම සහ තේරීම සඳහා එක් එක් උ. තා. ආ. සඳහා ප්‍රොක්සි සේවාදායක ස්ථාපනය කර ඇත.

ශ්‍රී ලං. උ. තා. අ. ආ. ඉතිහාසයේ පළමු වතාවට 2020 නව සිසුන් සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත ඉදිරිපත් කිරීමට වේදිකාවක් හඳුන්වා දෙන ලදී. එය ඉතා සාර්ථක වූ අතර විවිධ පාඨමාලා සඳහා අපට අයදුම්පත් ගණනාවක් ලැබුණි. මෙම ක්‍රියාවලිය තුළින් අවම ලේඛන කටයුතු, අවම කාලය සහ ඉහළ නිරවද්‍යතාවයකින් සිසුන් බඳවා ගැනීම පහසු කිරීමට අපට හැකි වූ අතර බඳවා ගැනීමේ ක්‍රියාවලිය නව ක්‍රියා පටිපාටියක් සමඟ විධිමත් කරන ලදී.උ. තා. ආ. සංවර්ධනය සඳහා ශ්‍රී ලං. උ. තා. අ. ආ. සෑම විටම අවධානය යොමු කරයි. 2020 දී නාවපිටිය සහ මන්නාරම උ. තා. ආ. සඳහා බහුමහල් ගොඩනැගිලි සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ මූලික කටයුතු අවසන් කරන ලදී. කාර්ය මණ්ඩලයේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා AHEAD ව්‍යාපෘතිය හරහා අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. ඵලදායී ලෙස ඉගැන්වීමේ- ඉගෙනුම් පරිසරයට පහසුකම් සැපයීම සඳහා උ. තා.ආ.වල යටිතල පහසුකම් 2020 දී වැඩිදියුණු කරන ලදී. ශ්‍රී ලං. උ. තා. අ. ආ විසින් උ. තා. ආ. හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එවැනි අවශ්‍යතා සපුරාලීමේ වගකීම භාර ගන්නා ලදී.

පස් මහල් ගොඩනැගිලි ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතුවලින් 90%ක් පමණ අවසන් කර ඇත. මෙම ඉදිකිරීම් ව්‍යාපෘති අතරින් ගාල්ල උ. තා. ආ. ගොඩනැගිල්ල නිම කරන ලදී.

ශ්‍රී ලං. උ. තා. අ. ආ.ක්‍රියාවලියේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණද, අපගේ සිසුන්ගේ සිහිනය තවදුරටත් යතාර්ථයක් බවට පත් කිරීම සඳහා ඉලක්කයක් සපුරා ගත යුතුව ඇත.-උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය අපගේ අවසාන ඉලක්කය වන අතර අප අපගේ ඉලක්කය කරා ගමන් කළ යුතුය.

ශ්‍රී ලං. උ. තා. අ. ආ. පාලක සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කැපවූ කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ විධායක කාර්ය මණ්ඩලය, සිසුන් සහ ශ්‍රී ලං. උ. තා. අ. ආ. සංවර්ධනය සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනා වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. ඔවුන්ගේ සහයෝගය හා උපකාර නොමැති ව කිසිවක් අත්කර ගත නොහැකි වනු ඇත. ශ්‍රී ලං. උ. තා. අ. ආ. තවදුරටත් සංවර්ධනය කිරීමේ ඒකායන බලාපොරොත්තුවක් සහිත ව 2021 වර්ෂය පිළිගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

මහාචාර්ය කේ. එල්. ජයරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

පටුන

I	ආරම්භය සහ විකාශනය		6
II	ආයතනික තොරතුරු - 2020		7
III	කළමනාකාරීත්වය		10
IV	කාර්ය මණ්ඩල තොරතුරු	11-	12
V	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සංවිධාන ව්‍යුහය		13
VI	උසස් තාක්ෂණ ආයතනයේ සංවිධාන ව්‍යුහය		14
VII	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ශාඛා ජාලය		15
VIII	**අධ්‍යයන කටයුතු/ සැලසුම් හා පර්යේෂණ අංශය**		16
	ශිෂ්‍ය බඳවාගැනීම්		17
	අධ්‍යයන දින දර්ශනය		17
	ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා	17-	19
	ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2020		19
	2020 වසරේ වැදගත් ශාස්ත්‍රීය කමිටු රැස්වීම් තීරණ	20-	24
IX	**සැලසුම් හා පර්යේෂණ අංශය**		25
	පර්යේෂණ දීමනා	25-	31
	පර්යේෂණ ප්‍රකාශන	31-	35
	පර්යේෂණ ක්‍රියාකාරකම්	36-	37
	කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්		38
	විෂයමාලා සංශෝධනය		39
X	**විභාග අංශය**		40
	විභාග පරිපාලනය	40-	41
	විභාග ප්‍රතිඵල සාරාංශය	41-	44
XI	**කළමනාකරණ තොරතුරු පද්ධති අංශය**		45
	2020 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්	46-	48
XII	**පාලන අංශය**		49
	මානව සම්පත් ලහා කර ගැනීම		50
	අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු - 2020	51-	53
	උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය 2020		54
	උසස් තාක්ෂණ ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය 2020		55
	පුහුණු වැඩසටහන්		56
XIII	**ඉංජිනේරු අංශය**	57-	58
	සාමාන්‍ය ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු - 2020	59-	60
XIV	**නීති අංශය**		61
	පාලක සභාව විසින් ගනු ලැබූ වැදගත්ම තීරණ - 2020		62
XV	**ගිණුම් අංශය**	63-	76
XVI	**අභ්‍යන්තර විගණන අංශය**		77
XVII	විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු	78-	87
XVIII	තිරසාර සංවර්ධනය පිළිබඳ වාර්තාව	88-	89

කෙටි යෙදුම්

උ.තා.ආ.	උසස් තාක්ෂණ ආයතනය
උ. ජා. ඩි.	උසස් ජාතික ඩිප්ලෝමා
උ.ජා.ආ.තා.ඩි.	උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමාව
උ.ජා.ඉංග්‍රීසි ඩි.	උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව
උ.ජා.ඉං.ඩි.(යාන්ත්‍රික)	උසස් ජාතික ඉංජිනේරු (යාන්ත්‍රික) ඩිප්ලෝමාව
උ.ජා.ඉං.ඩි.(විදුලි හා විද්‍යුත්)	උසස් ජාතික ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්) ඩිප්ලෝමාව
උ.ජා.ඉං.ඩි. (සිවිල්)	උසස් ජාතික ඉංජිනේරු (සිවිල්) ඩිප්ලෝමාව
උ.ජා.ක.ඩි.	උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව
උ.ජා.ග.ඩි.	උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව
උ.ජා.ගොා.සේ.ඉං.ඩි.	උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව
උ.ජා.තා.කෘ. ඩි.	උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්මය) ඩිප්ලෝමාව
උ.ජා.තොා.තා.ඩි.	උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව
උ.ජා.පා.වි.නි.තා.ඩි.	උසස් ජාතික පාරිභෝගික විද්‍යාව සහ නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමාව
උ.ජා.ප්‍ර.ස.ඩි.	උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව
උ.ජා.ව්‍යා.ක.ඩි	උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව
උ.ජා.ව්‍යා.පරි.ඩි.	උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව
උ.ජා.ව්‍යා.මූ.ඩි.	උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව
උ.ජා.සං.ස.ක.ඩි.	උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමාව
කළමනා. සහ ගිණුම්ක.	කළමනාකරණ සහ ගිණුම්කරණය
නිල.	නිලධාරි
රු.	රුපියල්
ශ්‍රී ලං. උ. තා. අ.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ආරම්භය සහ විකාශනය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, 1995 අංක 29 දරන උසස් තාක්ෂණ ආයතන පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතරින් ප්‍රමුඛ ස්ථානයක සිටින ආයතනයකි. මෙය අපේ රටේ සිසු දරු දැරියන්ගේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් දිවයින පුරා ක්‍රියාත්මක වන ආයතනයකි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ම උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යක්ෂ සහ අධ්‍යයන සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් පත් කරන ලද නිලධාරී මඩුල්ලකින් ආයතන පද්ධතිය සමන්විත වේ.

එහි දී ලංකාවේ පළාත් සියල්ලක් ම ආවරණය වන පරිදි උසස් තාක්ෂණ ආයතන 19 කින් සමන්විත වන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා ඔස්සේ දැනුමැති හා නිපුණ ශ්‍රම බලකායක් සමාජගත කිරීමේ අමිල මෙහෙවරක නිරත වේ.

<u>උසස් තාක්ෂණ ආයතන</u>

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. දෙහිවල
7. ගම්පහ
8. ගාල්ල
9. යාපනය
10. මහනුවර
11. කෑගල්ල
12. කුරුණෑගල
13. මන්නාරම
14. නාවලපිටිය
15. රත්නපුරය
16. සමන්තුරය
17. තංගල්ල
18. ත්‍රිකුණාමලය
19. වව්නියාව

ආයතනික තොරතුරු - 2020

ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා	- අමාත්‍ය, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය
ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මහතා	- ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා	- අමාත්‍ය, අධ්‍යාපන අමාත්‍යාංශය
මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා මහතා	- ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ටී. එන්. හෙට්ටිආරච්චි මහතා	- හිටපු අධ්‍යක්ෂ ජනරාල්	2019/12/09- 2020/01/23
ආචාර්ය කේ. එල්. ජයරත්න මහතා	- අධ්‍යක්ෂ ජනරාල්	2020/02/03 සිට මේ දක්වා
එන්. එම්. කේ. කේ. නවරත්න මහතා	- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් **(පරිපාලන හා මූල්‍ය)**	2018/06/01 සිට මේ දක්වා
ජේ. එච්. ගුණරත්න මිය	- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් **(අධ්‍යයන කටයුතු / සැලසුම් හා පර්යේෂණ)**	2019/04/01 සිට මේ දක්වා
එම්. පී. කේ. රත්නායක මිය	- අධ්‍යක්ෂ **(විභාග)**	2019/07/01 සිට මේ දක්වා
ආචාර්ය ඩබ්ලිව්. බී. කේ. බණ්ඩාර මිය	- අධ්‍යක්ෂ **(සැලසුම් හා පර්යේෂණ)**	2017/03/14 සිට මේ දක්වා
බී. එම්. ටී. චන්දික මහතා	- අධ්‍යක්ෂ	2017/10/16 සිට මේ දක්වා

වගුව 1 : පාලක සභාව

	පාලක සභා සාමාජිකයාගේ නම	තනතුර සහ ආයතනය
1	අනුර දිසානායක මහතා	පාලක සභා සභාපති, ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
2	මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා මහතා	පාලක සභා සභාපති, ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
3	ආචාර්ය කේ. එල්. ජයරත්න මහතා	අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10
4	පී. එන්. කේ. මලලසේකර මිය	අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුව, නො 557, ඕල්කට් මාවත, කොළඹ 10
5	ලාල් සමරසේකර මහතා	අතිරේක ලේකම් (පරිපාලන), කම්කරු අමාත්‍යාංශය, 6 වන මහල, "මෙහෙවර පියස", කොළඹ 5
6	ඩබ්. එම්. දීප්ති ප්‍රනාන්දු මිය	අතිරේක ලේකම් (පරිපාලන), ඉඩම් අමාත්‍යාංශය, මිහිකත මැදුර, අංක 6/1200, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
7	ඊ. ඒ. ඒකනායක මිය	සහකාර ලේකම්, අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
8	ඩබ්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර මහතා	අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා පිහිටුවීම), අධ්‍යාපන අමාත්‍යාංශය, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
9	ආචාර්ය රෝහිත සිල්වා මහතා	අධ්‍යක්ෂක, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය, 21, ශ්‍රී සුන්නන්දාරාම පාර, කළුබොවිල
10	ටී. ඩී. එස්. පී. පෙරේරා මහතා	අතිරේක ලේකම්, (තාක්ෂණ හුවමාරු) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, 3 වන මහල, සෙත්සිරිපාය, අදියර 1, බත්තරමුල්ල
11	චමිලා කුරේ මිය	ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය, එච්.එන්.බී. කුළුන, 12,479 මට්ටම ටී. බී. ජයා මාවත, කොළඹ 10
12	ඉංජිනේරු (මහාචාර්ය) උදයංග හේමපාල මහතා	ඉංජිනේරු ආයතනය, 62, සමගි මාවත, මාම්පේ, පිලියන්දල
13	හේමා ධර්මවර්ධන මිය	ඒ 22, පාසල් මාවත, නාවල
14	ඉංජිනේරු දුමින්ද අනුරුද්ද මහතා	නිකවෙල, මොරගොල්ලගම
15	සංජය ගමගේ මහතා	16/34, නීතීඥ සංකීර්ණය, හල්ට්ස්ඩ්‍රොප්

විගණන සහ කළමනාකරණ කමිටුව

එස්. එච්. හරිස්චන්ද්‍ර මයා	-	සභාපති
ලසන්ත වික්‍රමසිංහ මයා	-	සාමාජික
යූ. එල්. අතුකෝරල මයා	-	විගණන අධිකාරි
ආර්. එම්. ඩී . ඩී . රාජපක්ෂ මයා	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක

විගණක

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

අංක 306/ 72, පොල්දූව පාර, බත්තරමුල්ල

ලියාපදිංචි ලිපිනය හා ප්‍රධාන කාර්යයාලය

අංක 320, "ජනවතු පියස"

ටී. බී. ජායා මාවත

කොළඹ 10

ප්‍රධාන බැංකුකරු

මහජන බැංකුව

මූල්‍ය දින දර්ශනය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

දුරකථන අංක : +94112691307/ +94112691319

වෙබ් අඩෙවිය : www.sliate.ac.lk

කළමනාකාරීත්වය

(ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ උසස් තාක්ෂණ ආයතන)

අධ්‍යක්ෂ ජනරාල්

ටී. එන්. හෙට්ටිආරච්චි මයා	පශ්චාත්උපාධිධාරී
ආචාර්ය කේ. එල්. ජයරත්න මහතා	ආචාර්ය

නියෝජ අධ්‍යක්ෂ ජනරාල්

එන්. එම්. කේ. කේ. නවරත්න මයා	පාලන හා මුදල්	විද්‍යාපති
ජේ. එච්. ගුණරත්න මිය	අධ්‍යයන කටයුතු සැලසුම් හා පර්යේෂණ	විද්‍යාපති

අධ්‍යක්ෂ (ප්‍රධාන කාර්යාලය)

එම්. පි. කේ. රත්නායක මිය	අධ්‍යක්ෂ (විභාග)	දර්ශනපති
ආචාර්ය ඩබ්. බී. කේ. බණ්ඩාර මිය	අධ්‍යක්ෂ (අධ්‍යයන කටයුතු / සැලසුම් හා පර්යේෂණ)	ආචාර්ය
බී. එම්. ටී. චන්දික මයා	අධ්‍යක්ෂ II	විද්‍යාපති

අධ්‍යක්ෂ(උසස් තාක්ෂණ ආයතන)

අධ්‍යක්ෂ (වැ.බ.)	උ.තා.ආ. - අම්පාර	බී.ගජසිංහ මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. බදුල්ල	බී.ගජසිංහ මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ (වැ.බ.)	උ.තා.ආ. - දෙහිවල	එස්.එස්. සමරක්කොඩි මිය	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - ගාල්ල	එස්. රාමනායක මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - යාපනය	කේ.කොහිලන් මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - මහනුවර	ජී..ඒ. කේ. සිරිසුමන මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - කුරුණෑගල	ආර්.කේ.පි. කුමාර මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ.- කොළඹ	එන්.එන්.පී. ඩයස් මිය	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - ගම්පහ	ඒ.ජී.ඒ. ජලිත කුමාර මයා	විද්‍යාපති (ව්‍යාපාර පරි.)
අධ්‍යක්ෂ	උ.තා.ආ. ත්‍රිකුණාමලය	ජේ.ප්‍රතීපන් මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - කෑගල්ල	ඊ.එම්.ඩී.ජේ. ඒකනායක මිය	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - අනුරාධපුර	ජී.ඒ.එස්.එම්. ගනේපොල	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - නාවලපිටිය	ටී.එච්.එස්.එස්.බණ්ඩාර මිය	විද්‍යාපති (ව්‍යාපාර පරි.)
අධ්‍යක්ෂ	උ.තා.ආ. - රත්නපුර	යූ.වී.එස්. රෝහිත මයා	විද්‍යාපති
අධ්‍යක්ෂ	උ.තා.ආ. - මඩකලපුව	එස්. ජෙයපාලන් මයා	විද්‍යාපති
අධ්‍යයන සම්බන්ධීකරණ නිල.	උ.තා.ආ. - තංගල්ල	ජී.ආර්.සී. කුමාර මයා	විද්‍යාපති
අධ්‍යයන සම්බන්ධීකරණ නිල.	උ.තා.ආ. - සමන්තුරය	එස්.එල්. මුස්තාෆා මයා	විද්‍යාපති (ව්‍යාපාර පරි.)
අධ්‍යයන සම්බන්ධීකරණ නිල.	උ.තා.ආ. - වවුනියාව	පී.එලංකුමාරන් මයා	දර්ශණපති
අධ්‍යයන සම්බන්ධීකරණ නිල.	උ.තා.ආ. - මන්නාරම	ආර්.ජේ.එම්.කෘෂ්ස් මයා	විද්‍යාපති

කාර්ය මණ්ඩල තොරතුරු - 2020 දෙසැම්බර් 31 දිනට

වගුව **2 :** කාර්ය මණ්ඩල තොරතුරු

	තනතුරු නාමය	කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 අනුව වර්ගීකරණය	අනුමත තනතුරු	දැනට පවතින	ඉදිරි පුරප්පාඩු	සේවා කාණ්ඩය
කළමනාකරණ කාර්ය මණ්ඩලය						
1	අධ්‍යක්ෂ ජනරාල්	HM 2 - 3	1	1	0	ජ්‍යෙෂ්ඨ
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන)	HM 2 - 1	1	1	0	ජ්‍යෙෂ්ඨ
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අ.ක/ සැල. හා පර්.)	HM 2 - 1	1	1	0	ජ්‍යෙෂ්ඨ
4	අධ්‍යක්ෂ (පාලන) උ. තා. ආ. අධ්‍යක්ෂ	HM 1 - 3	1	0	1	ජ්‍යෙෂ්ඨ
5	අධ්‍යක්ෂ (විභාග)	HM 1 – 3	1	1	0	ජ්‍යෙෂ්ඨ
6	අධ්‍යක්ෂ (සැල. හා පර්.)	HM 1 – 3	1	1	0	ජ්‍යෙෂ්ඨ
7	අධ්‍යක්ෂ (උ. තා. ආ.)	HM 1 – 3	9	8	1	ජ්‍යෙෂ්ඨ
8	අධ්‍යක්ෂ II	HM 1 – 1	8	7	1	ජ්‍යෙෂ්ඨ
	කළමනාකරණ කාර්ය මණ්ඩල එකතුව		**23**	**20**	**3**	
අධ්‍යයන කාර්ය මණ්ඩලය						
9	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	AR 2	60	60	-	ජ්‍යෙෂ්ඨ
10	කථිකාචාර්ය	AR 1 – I		26		ජ්‍යෙෂ්ඨ
11	සහකාර කථිකාචාර්ය	AR 1- II	207	152	29	ජ්‍යෙෂ්ඨ
	අධ්‍යයන කාර්ය මණ්ඩල එකතුව		**267**	**238**	**29**	
අනධ්‍යයන කාර්ය මණ්ඩලය						
12	ඉංජිනේරු (සිවිල්)	MM 1 -1	1	1	0	ජ්‍යෙෂ්ඨ
13	තොරතුරු තාක්ෂණ කළමනාකරු	MM 1 -1	1	0	1	ජ්‍යෙෂ්ඨ
14	ලේඛකාධිකාරි	MM 1 -1	7	6	1	ජ්‍යෙෂ්ඨ
15	ගණකාධිකාරි	MM 1 -1	17	15	2	ජ්‍යෙෂ්ඨ
16	අභ්‍යන්තර විගණක	MM 1 -1	1	0	1	ජ්‍යෙෂ්ඨ
17	නීති නිලධාරි / පාලක සභාවේ ලේකම්	MM 1 -1	1	1	0	ජ්‍යෙෂ්ඨ
18	සහකාර ලේඛකාධිකාරි	JM 1 -2	14	14	0	තෘතික
19	පුස්තකාලාධිපති	JM 1 - 2	14	11	3	තෘතික
20	ඉංග්‍රීසි උපදේශක	MA - 5	4	2	2	තෘතික
21	ශිල්ප ප්‍රදර්ශක	MA – 4	97	70	27	තෘතික
22	පාලන සහකාර	MA - 3	4	4	0	ද්විතීයික
23	මූල්‍ය සහකාර *	MA - 3	1	0	1	ද්විතීයික
24	පුස්තකාල සහකාර	MA - 3	10	7	3	ද්විතීයික
25	ගොවිපල කළමනාකරු	MA 2 -2	3	3	0	ද්විතීයික

	තනතුරු නාමය	කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 අනුව වර්ගීකරණය	අනුමත තනතුරු	දැනට පවතින	ඉදිරි පුරප්පාඩු	සේවා කාණ්ඩය
26	තාක්ෂණික නිලධාරී	MA 2 -2	1	1	0	ද්විතීයික
27	කළමනාකරණ සහකාර	MA 1 -2	138	133	5	ද්විතීයික
28	පරිගණක විද්‍යාගාර සහකාර *	MA 1 -2	2	1	1	ද්විතීයික
29	විද්‍යාගාර සහකාර *	MA 1 -2	4	2	2	ද්විතීයික
30	ගබඩාකරු	MA 1 - 2	12	9	3	ද්විතීයික
31	නේවාසික පාලිකා/ නේවාසික පාලක	MA 1 - 2	10	7	3	ද්විතීයික
32	කාර්මික ශිල්පි	PL 3	17	8	9	ප්‍රාථමික
33	මේසන්/ ජල නල කාර්මික	PL 2	3	3	0	ප්‍රාථමික
34	සහකාර නේවාසික පාලිකා	PL 1	1	1	0	ප්‍රාථමික
35	පරිගණක විද්‍යාගාර සහයක *	PL 1	1	0	1	ප්‍රාථමික
36	වැඩහල් සහයක *	PL 1	6	5	1	ප්‍රාථමික
37	කාර්යාල කාර්ය සහයක / පණිවිඩකරු	PL 1	3	2	1	ප්‍රාථමික
38	කෝකියා	PL 1	1	0	1	ප්‍රාථමික
39	රෝනියෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	PL 1	2	2	0	ප්‍රාථමික
40	රියදුරු	PL 3	18	15	3	ප්‍රාථමික
41	විද්‍යාගාර සහයක *	PL 1	4	2	2	ප්‍රාථමික
42	කම්කරු	PL 1	49	47	2	ප්‍රාථමික
43	පුස්තකාල සහයක *	PL [II]	10	10	0	ප්‍රාථමික
44	සනීපාරක්ෂක කම්කරු *	PL 1 [6]	4	3	1	ප්‍රාථමික
45	මුරකරු *	PL 1 [7]	7	0	7	ප්‍රාථමික
	අනධ්‍යයන උපකාරක කාර්ය මණ්ඩලය		**468**	**385**	**83**	
	මුළු එකතුව		**758**	**63**	**115**	

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සංවිධාන ව්‍යුහය



උසස් තාක්ෂණ ආයතනයේ සංවිධාන ව්‍යුහය



ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ශාඛා ජාලය



අධ්‍යයන කටයුතු/ සැලසුම් හා පර්යේෂණ අංශය

හැඳින්වීම

නව උසස් අධ්‍යාපන සංස්කෘතියක් තුළ ශිෂ්‍ය හා ආයතනික ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කරන අන්තර් විනයානුකූල පරිසරයක් නිර්මාණය කිරීම, මෙම අංශයේ මෙහෙවරයි.

ඉලක්කගත ක්ෂේත්‍රයන්හි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා තුළින් සිසුන්ගේ සහ ආයතනයේ පෞද්ගලික හා වෘත්තීය සංවර්ධනයට සහාය වීම, උසස් තාක්ෂණ ආයතනවල කාර්ය මණ්ඩලය සමඟ එකඟතාවයකට පැමිණීම මෙන්ම ඉහත ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය සහතික කිරීම ද මෙහි අරමුණු වේ.

වගුව 3: ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහන්

තාක්ෂණික පාඨමාලා		
අනු අංකය	**පාඨමාලා නාමය**	**පාඨමාලා කාලය (වසර)**
1	උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව	වසර $3\,1/2$
2	උසස් ජාතික ඉංජිනේරු (සිවිල්) ඩිප්ලෝමාව	වසර $3\,1/2$
3	උසස් ජාතික ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්) ඩිප්ලෝමාව	වසර $3\,1/2$
4	උසස් ජාතික ඉංජිනේරු (යාන්ත්‍රික) ඩිප්ලෝමාව	වසර $3\,1/2$
5	උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමාව	වසර $2\,1/2$
6	උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව	වසර $2\,1/2$
7	උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව	වසර $2\,1/2$
8	උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්මය) ඩිප්ලෝමාව	වසර 3
තාක්ෂණික නොවන පාඨමාලා		
අනු අංකය	**පාඨමාලා නාමය**	**පාඨමාලා කාලය (වසර)**
9	උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව	වසර 4
10	උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව	වසර $2\,1/2$
11	උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව	වසර $2\,1/2$
12	උසස් ජාතික පාරිභෝගික විද්‍යාව සහ නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමාව	වසර 3
13	උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව	වසර $2\,1/2$
14	උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව	වසර 3
15	උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව	වසර $2\,1/2$
16	උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමාව	වසර 3

ශිෂ්‍ය බඳවා ගැනීම - 2020

2020 අධ්‍යයන වර්ෂය සඳහා මාර්ගගත ක්‍රමයට **(Online)** සිසුන් ඇතුළත් කර ගැනීමට තීරණය කළ ද, කෝවිඩ් -19 තත්ත්වය හේතුවෙන් එය නියමිත දිනට සිදු කළ නොහැකි විය. මීට පෙර අධ්‍යයන වර්ෂවල ශිෂ්‍ය කණ්ඩායම් සඳහා විභාග පවත්වා නිම කිරීමට ද නොහැකි විය.

බඳවා ගැනීම සඳහා වන පුවත්පත් දැන්වීම් 2020 සැප්තැම්බර් 06 දින දිනමිණ, සන්ඩේ ඔබ්සර්වර් සහ වාරමන්ජාරි පුවත්පත්වල පළ වූ අතර 2020 සැප්තැම්බර් 04 දින රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයෙහි ද පළ කරන ලදී.

අධ්‍යයන දින දර්ශනය - 2020

2020 වර්ෂයේ දී, 2019 දෙවන සමාසිකයේ අවසන් වසර සියලු ම සිසුන් සඳහා සිය ප්‍රායෝගික පුහුණු කටයුතු, නිබන්ධන, පැවරුම් සහ විෂය මාලාව සම්පූර්ණ කිරීමට සති තුනක කාලයක් ලබා දෙන ලදී. ඉන් අනතුරුව විභාගය සාර්ථක ව පවත්වන ලදී.

<u>අවසන් වසර සිසුන් සඳහා අධ්‍යයන කාල සටහන</u>

2020.07.06 – 2020.07.17	-	ගොඩනැගිලි විෂබීජහරණය සිදු කිරීම
2020.07.18 – 2020.07.31	-	අධ්‍යයන ක්‍රියාකාරකම්
2020.08.01 – 2020.08.09	-	මැතිවරණ නිවාඩු
2020.08.10 - 2020.08.16	-	අධ්‍යයන ක්‍රියාකාරකම්
2020.08.17 – 2020.08.23	-	අධ්‍යයන නිවාඩු
2020.08.24 – 2020.09.16	-	සමාසික අවසාන විභාගය

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ක්‍රියාත්මක වන පාඨමාලා හදාරන සිසුන්ගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමට අමතර ව ක්ෂේත්‍රය තුළ එම ක්‍රියාකාරකම් ප්‍රායෝගික ව සිදු වන ආකාරය පිළිබඳ ව අත්දැකීම් ලබා දීමට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කෙරේ.

මේ සඳහා එක් එක් පාඨමාලාවේ එක් එක් විෂයයට අදාල ව 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනුමැතියෙන් උසස් තාක්ෂණ ආයතන සංවිධානය කරන ලද ක්ෂේත්‍ර චාරිකා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වගුව 4: ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා

අංක.	උ.තා.ආ.	ක්ෂේත්‍ර චාරිකාව	දිනය	පාඨමාලාව	අරමුණු	පිරිවැය රු.
1	මහනුවර	අලියා රෙස්ටෝ ආයතනය, සීගිරිය	20/2/2020	උ.ජා.සං. හා සත්කාරක ඩී.	ඉදිරිපෙළ කාර්යාල කළමනාකරණය, ගෘහ කළමනාකරණය, සත්කාරක සේවා හා ආහාරපාන පිළිබඳ දැනුම ලබා ගැනීම	20,000.00
2	ගාල්ල	දඹුල්ල ආර්ථික සංවර්ධන මධ්‍යස්ථානය	25/02/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්මය)	කෘෂිකාර්මික දේශීය නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම	32,000.00
3	ගාල්ල	කෙරවළපිටිය යුගදනාවී විදුලි බලාගාරය	11/03/2020	උ.ජා.ඉං.ඩි. (විදුලි)	ආවරණය කරන ලද විදුලි උත්පාදනය සහ සම්ප්‍රේෂණ දැනුම ලබා ගැනීම	44,000.00
4	ගම්පහ	වී අයි එන් ටී ක්ලෝනල් ආයතනය	20/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	ජෛව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම	3,000.00
5	ගාල්ල	උඩවලව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, අඹේපුස්ස	23/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	මිරිදිය මත්ස්‍ය වගාව සහ අභිජනනය, මෙහෙයුම් සහ භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම	25,000.00
6	බදුල්ල	ටොකියෝ සිමෙන්ති සමාගම, ත්‍රිකුණාමලය	25/03/2020	උ.ජා.ග.ඩි.	පිරිවැය ක්‍රියාවලිය සහ පිරිවැය හඳුනා ගැනීම	110,000.00
7	ගම්පහ	හොරණ පළතුරු පර්යේෂණ ආයතනය	25/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	පලතුරු බෝග වර්ග, බීජ ප්‍රචාරණ ක්‍රම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අලෙවිකරණ විශේෂතා පිළිබඳ දැනුම ලබා ගැනීම	16,480.00

අංක.	උ.තා.ආ.	ක්ෂේත්‍ර චාරිකාව	දිනය	පාඨමාලාව	අරමුණු	පිරිවැය රු.
8	ගම්පහ	හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය	26/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	තවාන් කළමනාකරණය සහ වෙළඳ ප්‍රචාරණ ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීම	7,000.00
9	ගම්පහ	දැව පුහුණු මධ්‍යස්ථානය, රත්මලාන	27/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	දැව වර්ගීකරණය, වර්ග, මිනුම් පිළිබඳ දැනුම ලබා ගැනීම	10,000.00
10	ගම්පහ	පේරාදෙණිය උද්භිද උද්‍යානය	30/03/2020	උ.ජා.තා.ඩි. (කෘෂිකර්ම)	විවිධ වර්ගයේ මල් හා ශාක හඳුනා ගැනීම	7,020.00

ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය- 2020

2019 වර්ෂයේ දී, පවත්වන ලද 16 වන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට අදාල ඩිප්ලෝමා සහතිකපත් 3670ක ප්‍රමාණයක් මුද්‍රණය සඳහා යොමු කළ අතර, මුද්‍රණය අවසන් වූ වහාම එක් එක් උසස් තාක්ෂණ ආයතනයන් වෙත බෙදා හැරීමට කටයුතු කරන ලදී. තව ද, අනභිමුඛයෙන් ඉදිරිපත් කළ සහතිකපත් මුද්‍රණය කිරීම අවසන් කර, එම අදාල සිසුන් වෙත යොමු කිරීමට ද කටයුතු කෙරුණි.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන් සඳහා 2020 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම සඳහා බණ්ඩාරණායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව වෙන් කර තිබූ නමුත්, පැතිරී යන කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් දින නියමයක් නොමැති ව තාවකාලිකව කල් දැමීමට සිදු විය.

වගුව 5: 2020 වර්ෂයට අදාල ශාස්ත්‍රීය කමිටු රැස්වීම්වල වැදගත් තීරණ

අංක	විස්තරය
	<u>154 වන ශාස්ත්‍රීය කමිටු රැස්වීම - 2020 පෙබරවාරි මස 11 වන දින</u>
154.3	**3.1 විෂයමාලා සංශෝධනයන්හි ප්‍රගතිය**
	විෂයමාලා සංශෝධන භාර දීමේ අවසන් කාලසීමාව 2019 වර්ෂයේ දෙසැම්බර් මස විය. මෙතෙක් සම්පූර්ණ කර ඇත්තේ පාඨමාලා හතකි. දැනට කර ගෙන යනු ලබන විෂයමාලා සංශෝධන 2020 පෙබරවාරි 29 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. උපාධි මට්ටම විෂයමාලා සංශෝධනය ඉදිරියේදී සිදු කිරීමට යෝජිත ය.
	3.2 සිසුන් බඳවා ගැනීම 2020
	2020 දී, සිසුන් බඳවා ගැනීම සඳහා මාර්ගගත පද්ධතිය හඳුන්වා දී ඇත. එම කාර්යය භාරය පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහන අධ්‍යක්ෂ, බී. එම්. ටී. චන්දික මහතා විසින් සංවිධානය කරනු ලැබේ. තම ආයතනයේ පවතින පහසුකම් අනුව සහ ඒවායේ ක්‍රියාත්මක වෙමින් පවතින පාඨමාලාවලට අමතර ව නව පාඨමාලා ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගන්නා ලෙස අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබා දී ඇත.
	3.3 සිසුන් බඳවා ගැනීමේ දැන්වීම 2020

	විෂය ධාරාව					
	වාණිජ්‍ය	කලා	ජීව විද්‍යාව	රසායන විද්‍යාව	ගණිතය	ඕනෑම
උ. ජා. ග. ඩි.	100%	-	-	-	-	-
උ. ජා. ක. ඩි.	50%	30%	-		-	20%
උ. ජා. තො. තා. ඩි.	-	-	30%	40%	-	30%
උ. ජා. සං. ස. ක. ඩි.	30%	50%	-	-	-	20%
උ. ජා. තා. කෘ. ඩි.	-	-	100%	-	-	-
උ. ජා. ආ. තා. ඩි.	50%	-	-	50%	-	-
උ. ජා. පා. වි. නි. තා. ඩි.	-	-	-	-	-	100%
උ. ජා.ඉංජිනේරු ඩි.	-	-	-		100%	-
උ. ජා. ව්‍යා. පරි. ඩි./ ව්‍යා. මූ. ඩි.	100%	-	-	-	-	-
උ. ජා. ව්‍යා. කළ. ඩි	-	-	-	-	-	100%

පුවත්පත් දැන්වීම 2020 මාර්තු මාසයේ පලවනු ඇත. අර්ධ කාලීන පාඨමාලා සඳහා අය කරන සමාසික ගාස්තුව ඉහළ නැංවීමට ද තීරණය කර ඇත.

පාඨමාලාවේ නම	පෙර ගාස්තුව (රු.)	යෝජිත ගාස්තුව (රු.)
ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	5,000/=	7,500/=
ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	8,000/=	12,000/=
තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	12,000/=	18,000/=

පාඨමාලා ගාස්තු 50% බැගින් වන පරිදි වාරික දෙකකින් ගෙවිය හැකි අතර, එය සමාසිකයක් ආරම්භයේ දී හා එම සමාසිකයේ විභාගයට පෙර ගෙවිය හැකි වේ.

එක් එක් පාඨමාලාව සඳහා වන තෝරාගැනීමේ නිර්ණායක බඳවා ගැනීමේ කමිටු විසින් තීරණය කර, අදහස් හා යෝජනා සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත යොමු කෙරේ. ඒවා පහත පරිදි වේ.

උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවට පමණක් තෝරාගැනීමේ තරහ විභාගයක් පවත්වනු ලැබේ.

අංක	විස්තරය
	<u>155 වන ශාස්ත්‍රීය කමිටු රැස්වීම - 2020 ජූනි මස 19 වන දින</u>

<table>
<tr><td>155.3</td><td>ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කටයුතු පිළිබඳ කරුණු</td></tr>
<tr><td></td><td>3.3 සිසුන් බඳවා ගැනීම</td></tr>
<tr><td></td><td>පවතින පහසුකම්වලට අනුව පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් සිසුන් බඳවා ගැනීමට තීරණය විය.</td></tr>
<tr><td></td><td>3.3.1 සිසුන් බඳවා ගැනීමේ පුවත්පත් දැන්වීම 2020 සහ සිසුන් බඳවා ගැනීමට අදාල තෝරා ගැනීමේ නිර්ණායක</td></tr>
<tr><td></td><td>පුවත්පත් දැන්වීම, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ගැසට් කිරීමට නොහැකි විය.
පසුගිය ශාස්ත්‍රීය කමිටු රැස්වීම් වාර්තාවේ 154.3, 3.3 හි සිසුන් බඳවා ගැනීම සඳහා වන තෝරාගැනීමේ නිර්ණායක හඳුන්වා දෙනු ලැබීය.
2020 දී අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා නව තේරීම් නිර්ණායක හඳුන්වා දී ඇත. 2020 ජුනි 09 වන දින පැවැත්වෙන පාලක සභා අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2020 ජූලි මාසයේ දී ගැසට් කිරීමට යෝජනා විය.
නවක සිසුන් බඳවා ගැනීම සඳහා වන නව තෝරාගැනීමේ නිර්ණායකවලට අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාඨමාලා කාණ්ඩ දෙකකට බෙදේ.
<table>
<tr><td>පළමු කාණ්ඩය: උසස් පෙළ Z අගය මත පදනම් වූ ශ්‍රී ලං. ඵ. තා. අ. ආ. පාඨමාලා</td><td>ඵ.ජා.ග.ඩි. , ඵ.ජා.ව්‍යා.පරි.ඩි. , ඵ.ජා.ව්‍යා.මූ. ඩි. , ඵ.ජා.ඉං.ඩි. (සිවිල්), ඵ.ජා.ඉං.ඩි. (යාන්ත්‍රික), ඵ.ජා.ඉං.ඩි. (විදුලි), ඵ.ජා.ප්‍ර.ස.ඩි. , ඵ.ජා.ගොඇ.ඉං.ඩි. , ඵ.ජා.තා.කෘ. ඩි.</td></tr>
<tr><td>දෙවන කාණ්ඩය: තෝරාගැනීමේ තරඟ විභාගයේ ලකුණු මත පදනම් වූ ශ්‍රී ලං. ඵ. තා. අ. ආ. පාඨමාලා</td><td>ඵ.ජා.ඉංග්‍රීසි ඩි., ඵ.ජා.තොඇ.තා.ඩි., ඵ.ජා.ක.ඩි., ඵ.ජා.ව්‍යා.ක.ඩි., ඵ.ජා.සං.ස.ක.ඩි., ඵ.ජා.ආ.තා.ඩි. , ඵ.ජා.පා.වි.නි.තා.ඩි.</td></tr>
</table>
සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට එක් කාණ්ඩයකට රු.500/= බැගින් විවිධ අධ්‍යයන වැඩසටහන් පහක උපරිමයකට ඉල්ලුම් කළ හැකි ය.
එක් අපේක්ෂකයෙකුට එක් කාණ්ඩයක් යටතේ එක් අයදුම්පතක් පමණක් යොමු කළ හැකි අතර යොමු කළ හැකි උපරිම අයද්ම්පත් ගණන 2කි. ඒ අනුව, උපරිම ගෙවීම රු.1,000/=කි.
තෝරා ගැනීමේ පරීක්ෂණයේ අන්තර්ගතය අදාළ විෂයානුබද්ධ ව 60% සහ තර්කානුකූල බුද්ධිය 40% කි.</td></tr>
<tr><td></td><td>3.3.2 මාර්ගගත ක්‍රමය ඔස්සේ සිසුන් ලියාපදිංචි කිරීම - 2020</td></tr>
<tr><td></td><td>පාඨමාලාවලට තෝරාගැනීමේ නව ක්‍රමවේද අනුව මාර්ගගත අයදුම්පතෙහි ආකෘතිය වෙනස් කළ යුතු වේ.</td></tr>
<tr><td></td><td>3.3.3 උසස් තාක්ෂණ ආයතනවල ආරම්භ කිරීමට නියමිත පූර්ණ කාලීන/ අර්ධ කාලීන පාඨමාලා</td></tr>
<tr><td></td><td>පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා අතර බඳවා ගැනීමේ අනුපාතයක් පවත්වා ගැනීමට තීරණය කරන ලදී.
අම්පාර උසස් තාක්ෂණ ආයතනය විසින් ඵ. ජා. ග. ඩි. (අර්ධ කාලීන) හා ඵ. ජා. තොඇ. තා. ඩි. (අර්ධ කාලීන) ආරම්භ කිරීමට ඉල්ලීමක් කර ඇත.</td></tr>
<tr><td></td><td>3.3 උසස් තාක්ෂණ ආයතනවල කෙටිකාලීන පාඨමාලා ආරම්භ කිරීම</td></tr>
<tr><td></td><td>මෙම ප්‍රතිපත්තිය පාලක සභාවට, අනුමැතිය සඳහා යොමු කරන ලදී. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණ හා ගණිතය සඳහා කඩිනම් සහතිකපත් වැඩසටහන් ආරම්භ කරන ලෙස ඉල්ලීම් කර ඇත.
මේ සඳහා අදාල විෂයයන්ට අදාල අංශ ප්‍රධානීන්ගෙන් යුක්ත කමිටු පත් කිරීමට තීරණය කරන ලදී.</td></tr>
<tr><td>අංක</td><td>විස්තරය</td></tr>
<tr><td></td><td>3.4 පාඨමාලාවන්ට අදාල කොටසක් වශයෙන් ක්ෂේත්‍ර චාරිකා සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය</td></tr>
<tr><td></td><td>මෙම කටයුතු සඳහා අධ්‍යක්ෂ, අංශ ප්‍රධානි සහ ගණකාධිකාරී වෙත බලය පැවරීමට තීරණය විය.</td></tr>
</table>

	විෂයමාලා අවශ්‍යතාවයට අනුව ක්ෂේත්‍ර වාරිකා සඳහා අයවැය සමඟ වාර්ෂික සැලැස්ම සකස් කර ඒ සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.
	3.5 සිසුන් සඳහා විනය නීති
	සෑම උසස් තාක්ෂණ ආයතනයකටම පොදු නීතිමාලාවක් ඇති කිරීමට තීරණය විය. අදාල ලේඛන සමාලෝචනය කිරීමට හා පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා නීති නිලධාරී ඇතුළු කමිටුවක් පත් කිරීමට තීරණය විය.
155.4	**උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කටයුතු**
	4.1 2020 **ජුනි** 12 **දක්වා උසස් තාක්ෂණ ආයතනයන්හි** 2019 **දෙවන සමාසිකයේ අධ්‍යයන වැඩසටහන්වල විෂය නිර්දේශ ආවරණ ප්‍රතිශත**
	ස්ථිර කථිකාචාර්යවරුන් තම දේශනවලින් 90%ක් ආවරණය කර තිබෙන මුත්, බාහිර කථිකාචාර්යවරුන්ට එලෙස සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව පෙනී යයි. අධ්‍යක්ෂ හා අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය යටතේ බාහිර කථිකාචාර්යවරුන් සඳහා සති තුනක් පුරාවට මාර්ගගත ක්‍රමය මගින් දේශන පැවැත්වීමට උපදෙස් දෙන ලදී. අත්සන් තැබීම හා ඇඟිලි සලකුණු තැබීම මගින් පැමිණීමේ වාර්තා සටහන් කිරීම අවශ්‍ය වේ.
	4.3 2019 දෙවන සමාසික විභාග
	2019 දෙවන සමාසිකයේ විභාග, පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අවසන් නොවූයෙන් පැවැත්වීමට නොහැකි විය. නැවත දැනුම් දෙන තුරු මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන නොකඩවා පැවැත්වීමට උපදෙස් දී ඇත.
	4.4 2019 වර්ෂයේ ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රගතිය - පළමු සමාසික විභාගය සහ විශේෂ පුනර් විභාගය - 2019
	පළමු අධ්‍යයන වසරේ දී, පළමු වතාවට විභාගයට පෙනී සිටි සිසුන්ගේ විභාග ප්‍රතිඵල මාර්ගගත ක්‍රමයට නිකුත් කරනු ඇත. තවදුරටත් කමිටුව විසින් සියලු ප්‍රතිඵල සතියක් ඇතුලත නිකුත් කිරීමට ඉල්ලීමක් කරන ලදී.
	4.5 උපාධි මට්ටම දක්වා වැඩසටහන් සංවර්ධනය
	මේ දක්වා පනත වැඩිදියුණු කිරීම සඳහා රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. එය අවසන් වූ වහාම පාර්ලිමේන්තුවට හා කැබිනට් මණ්ඩලයට අනුමැතියට යොමු කිරීමට නියමිත ය.
	<u>156 වන ශාස්ත්‍රීය කමිටු රැස්වීම - 2020 ජුනි මස 21 වන දින</u>
156.3	**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කටයුතුවලට අදාල පරිපාලනමය කරුණු**
	3.1 සිසුන් බඳවා ගැනීම 2020
	2020 සැප්තැම්බර් 04 වන දින ගැසට් නිවේදනය පළවනු ඇත. පුවත්පත් දැන්වීම භාෂා තුනකින් ඉරිදා පුවත්පත් තුනක 2020 සැප්තැම්බර් මස 06 දින පළවනු ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020 ඔක්තෝබර් මස 06 වන දින වේ. දෙවන කාණ්ඩයේ අයදුම්පත් සඳහා තෝරාගැනීමේ පරීක්ෂණ නොවැම්බර් මස පළමු හා දෙවන සතිවල පැවැත්වේ. තෝරාගැනීමේ පරීක්ෂණ සඳහා කැඳවීම විද්‍යුත් තැපෑල හෝ සාමාන්‍ය තැපැල් මගින් සිදු කෙරේ. තෝරාගනු ලැබූ සිසුන්ගේ නම් ලැයිස්තුව පාඨමාලා හා ආයතන වශයෙන් වෙබ් අඩෙවිය තුළ ප්‍රදර්ශනය කළ යුතු ය. *හඳුන්වාදීමේ වැඩසටහන - 2020 දෙසැම්බර් මස දින 05 ක්

	2021 ජනවාරි මස අධ්‍යයන කටයුතු ආරම්භ වේ. අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් පරිදි, අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුත්තේ, මාර්ගගත ව 30%ක් සහ පන්ති කාමර තුළ 70% බැගිනි. හැකි නම් දේශන පටිගත කර ඒවා සංයුක්ත තැටි ආකාරයෙන් ලබා දිය හැක. මාර්ගගත ව දේශන මෙහෙයවීමේ දී, බාහිර කථිකාචාර්යවරුන්ගේ ගෙවීම්, ඔවුන් විසින් සකසන ලද ඉගෙනුම් කට්ටල පරීක්ෂා කිරීම හරහා අදාල අංශ ප්‍රධානීන්ගේ අනුමැතිය ලබා දීමෙන් පසුව සිදුවනු ඇත. බාහිර කථිකාචාර්යවරුන්ට ගෙවීම් සඳහා වූ චක්‍රලේඛය, සංශෝධනය කර පාලක සභාවට යොමු කළ යුතු අතර අනතුරුව එය සියලු උසස් තාක්ෂණ ආයතන දැනුම්වත් කළ යුතු ය.
	3.3.1 ගැසට් නිවේදනය සහ පුවත්පත් දැන්වීම
	පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී සිදු කළ යුතු ගෙවීම් සම්බන්ධ ව ගැසට් නිවේදනය සහ පුවත්පත් දැන්වීම සංශෝධනය විය යුතු බවට උපදෙස් දෙන ලදී. ගෙවීම් ඍජුව ම බැංකු හරහා සිදු කළ යුතුය. මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් සිදු කිරීමට අවසර නොලැබේ. ගනුදෙනු පත්‍රිකාවේ සඳහන් ගනුදෙනු අංකය පද්ධතියට ඇතුලත් කර, එය අනුපිටපත් අංකයක් ද යන්න පරීක්ෂා කළ යුතුය.
	3.3.2 මාර්ගගත ලියාපදිංචි කිරීමේ පද්ධතිය 2020
	මාර්ගගත අයදුම් පත්‍රයේ සුළු සංශෝධන: 1. පළමුව විෂය ධාරව ද, පසුව පූර්ණ කාලීන / අර්ධ කාලීන ද යන වග තෝරා ගත යුතු ය. 2. පාඨමාලා තොරතුරුවලට ප්‍රථම, පෞද්ගලික තොරතුරු සඳහන් කළ යුතුය. **කමිටුව විසින් පහත කරුණු යෝජනා කරන ලදී.** 1. අපේක්ෂකයෙකු කාණ්ඩ දෙකටම අයදුම් කරන්නේ නම්, ගෙවීම් වෙන වෙනම බැංකු ගත කළ යුතුය. මාර්ගගත ගෙවීම්වලට අවසර දෙනු නොලැබේ. 2. බැංකු කුවිතාන්සියෙහි ගනුදෙනු අංකය මාර්ගගත අයදුම්පතට ඇතුළත් කළ යුතුය.
156.4	**උසස් තාක්ෂණ ආයතනයන්හි අධ්‍යයන කටයුතු**
	4.3 කොවිඩ්- 19 අතරතුර මාර්තු සිට මේ දක්වා කාලය තුළ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම.
	විභාගයෙන් පසු උසස් තාක්ෂණ ආයතනවල පුහුණු ඇගයුම් කටයුතු පැවැත්විය යුතු ය. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග කාලසටහන පිළියෙළ කළ යුතුය.
156.5	**වෙනත් කරුණු**
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලං. උ. තා. අ. ආ. අතර අවබෝධතා ගිවිසුම
	අවබෝධතා ගිවිසුම, කථිකාචාර්යවරුන් සඳහා වන ප්‍රතිලාභ කිහිපයක් ගෙනහැර දක්වන නමුත් සිසුන් සඳහා වන ප්‍රතිලාභ පිළිබඳ සම්පූර්ණයෙන් සඳහන් නොකරයි. විෂයමාලා සංශෝධනය සැලකිල්ලට ගනිමින් මෙය කෙටුම්පත් කර නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන්, ජ්‍යෙෂ්ට කථිකාචාර්යවරුන් සහ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට යෝජනා විය.
	5.2 ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වැටුප් වර්ධක
	ශිල්ප ප්‍රදර්ශකයින්ගේ රාජකාරි වේලාවන් සහ වැඩ ප්‍රමාණය හඳුනා ගන්නා ලදී. පාලක සභා පත්‍රිකාවක් පාලක සභාවට යොමු කර ඒ අනුව ක්‍රියාත්මක කරනු ඇත. තවද, මේ දක්වා වැටුප් වැඩිවීම් සඳහා පෙර භාවිතයන් අනුගමනය කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී.
	<u>157 වන ශාස්ත්‍රීය කමිටු රැස්වීම 2020 ඔක්තෝබර් 23 දින</u>
157.3	**උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කටයුතුවලට අදාල පරිපාලනමය කරුණු**
	3.2 2019 දෙවන අධ්‍යයන වාර විභාග (ඉතිරි සිසුන් සඳහා)

	කෝවිඩ් - 19 වසංගතය හේතුවෙන් රටේ උද්ගතව පවතින තත්ත්වය අනුව, 2019 දෙවන අධ්‍යයන වාරයේ නොපැවැත්වූ විභාග සඳහා නිශ්චිත දිනයක් තීරණය කළ නොහැකි බැවින් . විභාගය ආරම්භ කිරීමට පෙර ඉතිරි අධ්‍යයන කටයුතු සඳහා සතියක කාලයක් ලබා දීමට තීරණය විය.
	3.4 කොවිඩ්- 19 අතරතුර මාර්තු සිට මේ දක්වා කාලය තුළ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම
	2020 මාර්තු සිට මේ දක්වා කොවිඩ් - 19 කාල සීමාව තුළ කර්මාන්ත පුහුණුවේ මාස දෙකක් හෝ ඊට වැඩි කාලයක් නිරත වූවන් එය සම්පූර්ණ කළ අය ලෙස සැලකිය යුතු බව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය නිවේදනය කරයි. මාස දෙකකට අඩු කාලයක් පුහුණුවීම් සඳහා සහභාගී වූවන් නැවත පුහුණුවීම් ආවරණය කළ යුතු ය.
	3.5 නව බඳවා ගැනීම් 2020 මාර්ගගත ව
	මාර්ගගත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020 ඔක්තෝබර් 06 වන දින විය. ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 28001 කි. උසස් තාක්ෂණ ආයතන හා පාඨමාලා අනුව අයදුම්පත් වර්ග කර ඇත.
	3.6 නව බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණ
	දින 07 ක් තුළ පරීක්ෂණ 07 ක් සිදු කෙරේ. අධ්‍යක්ෂ ජනරාල්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(අධ්‍යයන කටයුතු/ සැලසුම් හා පර්යේෂණ) / අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂ චන්දික මහතා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විභාග මධ්‍යස්ථාන පිළිබඳව අවසන් තීරණ ගනු ලැබේ.
	<u>158 වන ශාස්ත්‍රීය කමිටු රැස්වීම 2020 නොවැම්බර් 02 දින</u>
158.1	**උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යයන කටයුතු**
	ශිෂ්‍යයන්ගේ ද එකඟතාව මත අධ්‍යයන කටයුතු මාර්ගගත ව කරගෙන යාමට කමිටුව යෝජනා කළේය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් හැර එක් එක් ශිෂ්‍ය කණ්ඩායම සඳහා පොදු කාලසටහන් ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට ඇතුලත් කළ යුතු ය. මෙම කාලසටහන් සකස් කර 2020 නොවැම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි සති 5 ක් සඳහා එක් එක් විෂය හෝ සංරචක සඳහා අන්තර්ගත ලේඛකයන් නම් කරන ලෙස සියලුම අංශ ප්‍රධානීනන්ට දන්වා ඇත. මෙම ලැයිස්තු සහ කාලසටහන් 2020 නොවැම්බර් 06 හෝ ඊට පෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන කටයුතු/ සැලසුම් හා පර්යේෂණ) වෙත යැවිය යුතුය. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සඳහා අන්තර්ගත ලිවීමේ ප්‍රගතිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන කටයුතු/ සැලසුම් හා පර්යේෂණ) විසින් සතිපතා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
158.2	**උසස් ජාතික ඩිප්ලෝමා ඉංග්‍රීසි සිසුන් සඳහා සීමාවාසික පුහුණුව**
	පාසල් නැවත විවෘත කිරීමට සමාන්තර ව කටයුතු කිරීමට තීරණය විය.

සැලසුම් හා පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ උසස් තාක්ෂණ ආයතන සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම, සැලසුම් හා පර්යේෂණ අංශය සතු වගකීමකි. තව ද වාර්ෂික වාර්තාව සකස් කිරීම, ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සකස් කිරීම, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන සඳහා මූල්‍ය ආධාර සැපයීම, මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ශිෂ්‍යයින් තෝරා ගැනීම මෙන් ම ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙහි කාර්ය මණ්ඩලයට පර්යේෂණ දීමනාවක් ලබා දීමට අමතර ව අධ්‍යයන ආශ්‍රිත ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම ද ඒ අතර වේ.

පර්යේෂණ දීමනා

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, සිය කාර්ය මණ්ඩලය වෙත පර්යේෂණ කටයුතුවලට නියැලීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කරයි. මේ සඳහා 02/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර ව පර්යේෂණ දීමනා ගෙවන අතර ප්‍රධාන ක්ෂේත්‍ර පහක් (5) ආවරණය වන පරිදි පර්යේෂණ කටයුතු සිදු කිරීමට අවකාශය සලසා දේ. එම විෂය ක්ෂේත්‍ර නම්, කළමනාකරණය හා ගිණුම්කරණය, ඉංග්‍රීසි, ඉංජිනේරු, තොරතුරු තාක්ෂණය මෙන් ම කෘෂිකර්මය හා ආහාර විද්‍යාව යනාදී විෂය ක්ෂේත්‍ර වේ.

පර්යේෂණ කළමනාකරණ කමිටුවේ නිර්දේශය හා පර්යේෂණ අධීක්ෂණ කමිටුවේ අනුමැතිය මත මෙකී ක්ෂේත්‍රවලට අදාළ ව ලැබෙන පර්යේෂණ යෝජනා සමාලෝචනයට අවශ්‍ය කටයුතු සිදු කෙරේ.

අභ්‍යන්තර සහ බාහිර සමාලෝචකයින් දෙපිරිසකගේ සහයෝගය මේ සඳහා ලබා ගන්නා අතර එහි දී, අභ්‍යන්තර සමාලෝචකයින් ලෙස ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙන් සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගන්නා ලද පර්යේෂණ පිළිබඳ දැනුමැති පිරිසකගේ ද බාහිර සමාලෝචකයින් ලෙස ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පද්ධතියේ පර්යේෂණ සම්බන්ධ හසල දැනුමක් ඇති පිරිසකගේ ද සහය ලබා ගැනේ.

දැනට ක්‍රියාත්මක වන චක්‍රලේඛයට අනුව, සමාලෝචනය සඳහා යොමු කරන පර්යේෂණ යෝජනා අනුමත වූයේ නම්, පර්යේෂණ දීමනාව ගෙවීම ආරම්භ වන්නේ, එය භාර දුන් දිනට පසු දාතම කොට ය. ඉහත චක්‍රලේඛයට අමතර ව, පර්යේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතන ප්‍රතිපත්ති ද අදාල වේ.

වගුව 6: පර්යේෂණ දීමනාව පිළිබඳ තොරතුරු 2020

(අ) 2020 වර්ෂයේ ආරම්භ කළ පර්යේෂණ පිළිබඳ තොරතුරු

	පර්යේෂකයාගේ නම	ආයතනය	විෂය ක්ෂේත්‍රය	පසුදාතම කළ දිනය/ ආරම්භ කළ දිනය
1	ජී. ආර්. සී. කුමාර	ගාල්ල	තොරතුරු තාක්ෂණය	පෙබරවාරි 2020- ජනවාරි 2023
2	එම්. ඊ. අයි. එල්. සිල්වා	කොළඹ	තොරතුරු තාක්ෂණය	මාර්තු 2020- පෙබරවාරි 2023

	පර්යේෂකයාගේ නම	ආයතනය	විෂය ක්ෂේත්‍රය	පසුදාතම කළ දිනය/ ආරම්භ කළ දිනය
3	එස්. රාමනායක	ගාල්ල	තොරතුරු තාක්ෂණය	ජනවාරි 2020- දෙසැම්බර් 2022
4	වයි. එම්. හිරිමුතුගොඩ	ගාල්ල	තොරතුරු තාක්ෂණය	අගෝස්තු 2020- ජූලි 2023
5	ජේ ප්‍රතීපන්	ත්‍රිකුණාමලය	තොරතුරු තාක්ෂණය	මැයි 2020- අප්‍රේල් 2023
6	ඒ. වී. එල්. වන්දිමා	ගම්පහ	තොරතුරු තාක්ෂණය	අගෝස්තු 2020- ජූලි 2023
7	එල්. ඒ. එම්. ඩබ්. අයි. සමරසේකර	කුරුණෑගල	තොරතුරු තාක්ෂණය	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
8	ජී. එස්. ටී. බණ්ඩාර	රත්නපුරය	තොරතුරු තාක්ෂණය	ජනවාරි 2020- දෙසැම්බර් 2022
9	එස්. එම්. එම්. මාලිකා	දෙහිවල	තොරතුරු තාක්ෂණය	පෙබරවාරි 2020- ජනවාරි 2023
10	එන්. ඒ. කන්නන්ගර	දෙහිවල	තොරතුරු තාක්ෂණය	ජූලි 2020- ජුනි 2023
11	එස්. කස්තුරි	මහනුවර	තොරතුරු තාක්ෂණය	අගෝස්තු 2020- ජූලි 2023
12	ජේ. ආර්. ජයසිංහ	දෙහිවල	තොරතුරු තාක්ෂණය	අගෝස්තු 2020- ජූලි 2023
13	කේ. තේවරූබන්	මඩකලපුව	තොරතුරු තාක්ෂණය	අගෝස්තු 2020- ජූලි 2023
14	එච්. එම්. එන්. එම්. වටගොඩකුඹුර	අම්පාර	කෘෂිකර්මය	ජූලි 2020- ජුනි 2023
15	අයි. එච්. ජයසිංහ	ගම්පහ	කෘෂිකර්මය	අගෝස්තු 2020- ජූලි 2023
16	ඩබ්. බී. කේ. බණ්ඩාර	ප්‍රධාන කාර්යයාලය	කෘෂිකර්මය	මාර්තු 2020- පෙබරවාරි 2023
17	එන්. එම්. කේ. කේ. බණ්ඩාර	ප්‍රධාන කාර්යයාලය	කෘෂිකර්මය	මාර්තු 2020- පෙබරවාරි 2023
18	නශීරා පරණමාන	ගාල්ල	කෘෂිකර්මය	ජනවාරි 2020- දෙසැම්බර් 2022
19	එම්. ආර්. ටී. එන්. කුමාර	අම්පාර	ඉංග්‍රීසි	සැප්තැම්බර් 2020- අගෝස්තු 2023
20	එම්. එම්. සී. මල්කාන්ති	බදුල්ල	ඉංග්‍රීසි	ජනවාරි 2020- දෙසැම්බර් 2022
21	ආර්. එම්. එම්. සී. රත්නායක	බදුල්ල	ඉංග්‍රීසි	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
22	ඩබ්. ඒ. නිහාල්	බදුල්ල	ඉංග්‍රීසි	අප්‍රේල් 2020- නොවැම්බර් 2021
23	එස්. සුභාහරන්	දෙහිවල	ඉංග්‍රීසි	මැයි 2020- අප්‍රේල් 2023
24	එච්. එම්. යූ. කේ. හේරත්	දෙහිවල	ඉංග්‍රීසි	ජුනි 2020- මැයි 2023
25	ඊ. පී. එම්. යූ. එදිරිසිංහ	දෙහිවල	ඉංග්‍රීසි	මාර්තු 2020- පෙබරවාරි 2023
26	ජේ. කේ. ඩී. සී. ආර්. ජයනෙත්ති	ගාල්ල	ඉංග්‍රීසි	අගෝස්තු 2020- ජූලි 2023
27	එච්. එම්. එච්. පී. ජයරත්න	කෑගල්ල	ඉංග්‍රීසි	අගෝස්තු 2020- ජූලි 2023
28	ඒ. එස්. ඩබ්. ගුණවර්ධන	කෑගල්ල	ඉංග්‍රීසි	අගෝස්තු 2020- ජූලි 2023
29	ටී. ජීවහන්	ත්‍රිකුණාමලය	ඉංග්‍රීසි	පෙබරවාරි 2020- ජනවාරි 2023
30	පී. ඒ. එස්. ජී. පද්මපෙරුම	ගම්පහ	ඉංග්‍රීසි	අගෝස්තු 2020- ජූලි 2023
31	එම්. එච්. ඩී. ඒ. එස්. එස්. එන්. මාසක්කාර	කුරුණෑගල	ඉංග්‍රීසි	පෙබරවාරි 2020- ජනවාරි 2023
32	එස්. කිල්බට්	ත්‍රිකුණාමලය	ඉංග්‍රීසි	පෙබරවාරි 2020- ජනවාරි 2023
33	වයි. අව්වුතන්	වවුනියාව	ඉංග්‍රීසි	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
34	ආර්. ජේ. මොහාන් කෘස්	මන්නාරම	ඉංග්‍රීසි	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
35	කේ. එම්. එස්. කේ. කරුණාරත්න	මහනුවර	ඉංග්‍රීසි	ජූලි 2020- ජුනි 2023

	පර්යේෂකයාගේ නම	ආයතනය	විෂය ක්ෂේත්‍රය	පසුදාතම කළ දිනය/ ආරම්භ කළ දිනය
36	ඒ. බී. අයි. කේ. ප්‍රේමසිරි	මහනුවර	ඉංග්‍රීසි	අගෝස්තු 2020- ජූලි 2023
37	බී. එම්. එස්. කේ. බණ්ඩාර	මන්නාරම	ඉංග්‍රීසි	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
38	එම්. එස්. ඉෂාර් අලි	අම්පාර	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
39	එස්. ටී. අහමෙඩ්	අම්පාර	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
40	එම්. සිරාජි	අම්පාර	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
41	එස්. එස්. එච්. උම්මා	මඩකලපුව	කළමනා. සහ ගිණුම්ක.	සැප්තැම්බර් 2020- අගෝස්තු 2023
42	එම්. ඒ. සී. එච්. පියතිලක	දෙහිවල	කළමනා. සහ ගිණුම්ක.	අගෝස්තු 2020- ජූලි 2023
43	තරණි වේදනායගම්	දෙහිවල	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
44	පී. ආර්. ප්‍රනාන්දු	ගම්පහ	කළමනා. සහ ගිණුම්ක.	අගෝස්තු 2020- ජූලි 2023
45	එස්. බුලත්සිංහලගේ	ගම්පහ	කළමනා. සහ ගිණුම්ක.	අගෝස්තු 2020- ජූලි 2023
46	ටී. රාමජෙයම්	යාපනය	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
47	එල්. සූරියකුමාරන්	යාපනය	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
48	ටී. අයි. වනරාජා	යාපනය	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
49	ටී. එච්. එස්. එස්. බණ්ඩාර	නාවලපිටිය	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
50	සී. එම්. සමරවික්‍රම	මහනුවර	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
51	ජේ. එම්. යූ. අයි. ජයසිංහ	මහනුවර	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
52	එස්. ජී. එන්. සී. කුමාරි	කුරුණෑගල	කළමනා. සහ ගිණුම්ක.	අගෝස්තු 2020- ජූලි 2023
53	බී. එම්. ඒ. පුෂ්පකුමාර	කුරුණෑගල	කළමනා. සහ ගිණුම්ක.	ජුනි 2020- මැයි 2023
54	එන්. ජී. එන්. ප්‍රියදර්ශනී	කුරුණෑගල	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
55	ඒ. එල්. ඒ. රහුමාන්	සමන්තුරය	කළමනා. සහ ගිණුම්ක.	නොවැම්බර් 2020- ඔක්තෝම්බර් 2023
56	එස්. එල්. මුස්තෆා	සමන්තුරය	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
57	එස්. ඇන්ටනි	ත්‍රිකුණාමලය	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
58	පී. එලන්ග්කුමාරන්	ත්‍රිකුණාමලය	කළමනා. සහ ගිණුම්ක.	මාර්තු 2020- පෙබරවාරි 2023
59	ජේ. එන්. ජෙනිටා	දෙහිවල	කළමනා. සහ ගිණුම්ක.	ජුනි 2020- මැයි 2023
60	ඒ. ආර්. අක්‍රම්	අම්පාර	කළමනා. සහ ගිණුම්ක.	නොවැම්බර් 2020- ඔක්තෝම්බර් 2023
61	එස්. පී. ජී. එම්. අබේරත්න	කෑගල්ල	කළමනා. සහ ගිණුම්ක.	දෙසැම්බර් 2020- නොවැම්බර් 2023

	පර්යේෂකයාගේ නම	ආයතනය	විෂය ක්ෂේත්‍රය	පසුදාතම කළ දිනය/ ආරම්භ කළ දිනය
62	යූ. ඩී. පී. ප්‍රියශාන්ත	රත්නපුරය	කළමනා. සහ ගිණුම්ක.	දෙසැම්බර් 2020- නොවැම්බර් 2023
63	එම්. අයි. එෆ්. ඉස්මෙල්	දෙහිවල	කළමනා. සහ ගිණුම්ක.	ජූලි 2020- ජුනි 2023
64	එස්. පී. සංජීව ප්‍රියංග	කොළඹ	කළමනා. සහ ගිණුම්ක.	අගෝස්තු 2020- ජූලි 2023
65	එල්. කේ. ලංකාතිලක	ප්‍රධාන කාර්යයාලය	කළමනා. සහ ගිණුම්ක.	ජූලි 2020- ජුනි 2023
66	රොමීටා ද සිල්වා	දෙහිවල	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
67	කේ. ඒ. ඒ. සී. එඩිවඩ්	ප්‍රධාන කාර්යයාලය	කළමනා. සහ ගිණුම්ක.	පෙබරවාරි 2020- ජනවාරි 2023
68	ඒ. කේ. ලියනගේ	කොළඹ	ඉංජිනේරු	පෙබරවාරි 2020- ජනවාරි 2023
69	එස්. එම්. සී. පී. කේ. සමරතුංග	කොළඹ	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2022
70	ඒ. එච්. එෆ්. සට්ටාර්	කොළඹ	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2023
71	එන්. ජේ. බී. ඉල්ලගොල්ල	කොළඹ	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2023
72	ඩබ්. ඒ. සුජීවනී	කොළඹ	ඉංජිනේරු	ඔක්තෝම්බර් 2020- සැප්තැම්බර් 2023
73	බී. කේ. ඩී. බාලසූරිය	කොළඹ	ඉංජිනේරු	ජූලි 2020- ජුනි 2023
74	ජී. ඒ. එස්. පෙරේරා	කොළඹ	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2023
75	එච්. පී. ඩී. යූ. ඉරෝශනී	ගාල්ල	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2023
76	ඩී. එම්. ටී. පී. ප්‍රනාන්දු	ගාල්ල	ඉංජිනේරු	ජූලි 2020- ජුනි 2023
77	එන්. එච්. ඩී. එස්. මානවඩු	ගාල්ල	ඉංජිනේරු	මාර්තු 2020- පෙබරවාරි 2023
78	එස්. ජෙයකුමාර්	යාපනය	ඉංජිනේරු	අගෝස්තු 2020- ජූලි 2023
79	කේ. වී. ඩී. පෙරේරා	කොළඹ	ඉංජිනේරු	අගෝස්තු 2020- ජූලි 2023
	ii. ශ්‍රී ලංකා ව්‍යාපාරික සංවර්ධන මධ්‍යස්ථානය සමඟ වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු පුහුණු වැඩමුළු සහ ව්‍යුහගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ශ්‍රී ලංකා ව්‍යාපාරික සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගීතාවයෙන් වැඩමුළු, ව්‍යුහාත්මක වැඩසටහන් සහ පිටත පුහුණු සාපේක්ෂව වඩා ධනාත්මක වාතාවරණයක් තුළ ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවකයින්ගේ මානසිකත්වය හා ආකල්ප ආරක්ෂා කිරීම සඳහා සංවිධානය කිරීමට පාලක සභාව විසින් උපදෙස් දුන්නේය.	

වගුව 23: 2020 අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2020 රු.	2019 රු.
ආදායම්			
ආදායම් පුනරාවර්තන දීමනා			
* භාණ්ඩාගාර		900,286,000	830,000,000
විවිධ ආදායම්	1		
ආයතනික ආදායම්		44,772,088	102,365,801
වෙනත් ආදායම්		506,266,616	614,233,719
මුළු ආදායම්		1,451,324,704	1,546,599,520
වියදම්			
සේවක පාරිශ්‍රමික	2	(712,410,004)	(666,810,572)
ගමන් වියදම්	3	(1,652,646)	(3,642,208)
කොන්ත්‍රාත් සේවා	4	(172,890,092)	(202,125,188)
සැපයුම් සහ අවශ්‍යතා	5	(10,442,288)	(15,667,696)
නඩත්තු වියදම්	6	(10,334,631)	(16,468,708)
පුහුණු හා ඇගයීම්	7	(30,843,728)	(84,123,420)
වෙනත් වියදම්	8	(1,356,916)	(1,603,700)
ක්ෂයවීම	9	(465,838,136)	(570,329,747)
		(1,405,768,441)	(1,560,771,239)
අතිරික්ත /(හිඟ) හිමිකම් වෙනස්කම් වෙත මාරු කිරීම		**45,556,263**	**(14,171,719)**

වගුව 24: මූල්‍ය තත්වය ප්‍රකාශය - 2020 දෙසැම්බර් 31 දිනට

	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත & උපකරණ	9	5,183,531,320	5,369,482,530
		5,183,531,320	5,369,482,530
ආයෝජන	10	256,071,618	243,221,073
අස්පෘශ්‍ය වත්කම්	11	23,306,992	25,204,162
ජංගම වත්කම්			
තොග		3,348,082	3,532,907
තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම්, ණය ගැනියන් සහ ලැබිය යුතු ආදායම්	12	90,984,394	110,421,078
කෙටිකාලීන ආයෝජන	13	112,117,386	105,366,464
මුදල් හා මුදල් වලට සමාන දෑ	14	141,960,630	96,865,124
		348,410,492	316,185,573
මුළු වත්කම්		5,811,320,422	5,954,093,338
අරමුදල් & බැරකම්			
සමුච්චිත අරමුදල		4,604,447,441	4,583,394,241
විලම්භිත ප්‍රදාන		681,142,888	867,878,608
ප්‍රාග්ධන ප්‍රදාන- වියදම් නොකළ		13,256,490	5,738,363
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	15	172,193,112	154,346,043
ජංගම බැරකම්			
ණයහිමියෝ	16	207,778,247	198,802,816
සමුච්චිත වියදම්	17	92,315,776	101,625,426
තැන්පත් - පියවීමට ඇති	18	40,186,467	42,307,841
		340,280,490	342,736,083
මුළු අරමුදල් & බැරකම්		5,811,320,422	5,954,093,338

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී. ලං. ඌ. තා. අ. ආ. හි සාමාජිකයින් විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මහාචාර්ය කුෂිල සී. කේ. පෙරේරා
සභාපති- පාලක සභාව
ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

මහාචාර්ය කේ. එල්. ජයරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී. ලං. ඌ. තා. අ. ආ.

එන්. එම්. කේ. කේ. නවරත්න
නි. අ. ජ. (මුදල් හා පාලන)
ශ්‍රී. ලං. ඌ. තා. අ. ආ.

ඩී. ඩග්ලස්
ගණකාධිකාරී
ශ්‍රී. ලං. ඌ. තා. අ. ආ.

වගුව 25: 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ලැබීම්		
ආයතනික ආදායම්	44,630,536	104,323,705
වෙනත් ආදායම්	31,727,155	19,187,384
සමස්ත ලැබීම්	76,357,691	123,511,089
ගෙවීම්		
සේවක පාරිශ්‍රමික	(665,164,326)	(616,111,715)
ගමන් වියදම්	(1,576,702)	(3,174,374)
කොන්ත්‍රාත් සේවා	(134,338,253)	(164,629,798)
සැපයුම් හා අවශ්‍යතා	(9,367,860)	(14,875,931)
නඩත්තු	(9,233,069)	(15,188,426)
පුහුණු හා ඇගයුම්	(23,345,594)	(73,404,529)
වෙනත් ගෙවීම්	(204,500)	(452,200)
අත්තිකාරම්, ණයගැතියෝ හා පූර්ව ගෙවීම්	(1,173,799)	(1,380,467)
පියවීමට ඇති දෑ	(2,037,616)	6,294,401
ණයහිමියෝ	(70,515,357)	(327,248,670)
උපචිත වියදම් (පෙර වසරේ)	(77,808,710)	(84,703,971)
සමස්ත පුනර්වර්තන ගෙවීම්	(994,765,786)	(1,294,875,680)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(918,408,095)	(1,171,364,591)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ආයෝජන	(19,601,466)	(213,970,019)
ආපදා ණය	2,520,738	(3,195,843)
ඉඩම්, ගොඩනැගිලි ඉදිකිරීම් හා කාර්යය ප්‍රගතිය	(118,593,751)	(257,909,612)
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(54,622,504)	(15,102,273)
අස්පෘශ්‍ය වත්කම්	(1,483,000)	(2,328,475)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(191,828,923)	(492,506,221)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර ප්‍රදාන	1,155,286,000	1,436,000,000
බැංකු ගාස්තු	(2,416)	(1,500)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	1,155,283,584	1,435,998,500
ශුද්ධ වැඩිවීම /(අඩුවීම) - මුදල් හා මුදල් වලට සමාන දෑ	45,095,506	(227,872,312)
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාරම්භ	96,865,124	324,737,436
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාලාවසාන	**141,960,630**	**96,865,124**

වගුව 26: සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශය – 2020 දෙසැම්බර් 31 දිනට

විස්තරය	සමුච්චිත අරමුදල	උසස් අධ්‍යාපන අමාත්‍යාංශ	සුනාමි	IRQUE	EKSP	HETC ව්‍යාපෘතිය	ගොවිපල	දායකත්වය	අතිරික්තය/ (හිඟය)	එකතුව (රු.)
2019 ජන. මස 01 වන දිනට ශේෂය	1,400,948,861	445,610,289	469,709,912	794,810	3,004,305	129,480	396,411	1,747,904,298	179,675,927	4,248,174,293
2019 හිමිකම් වෙනස්වීම										
*ප්‍රාග්ධන දීමනා 2019								606,000,000		
*ප්‍රාග්ධන ප්‍රදානය -වියදම් කළ								(3,410,970)		
*වර්ෂය තුළ දායකත්වය						15,503,640		602,589,030		618,092,670
*වසර තුළ වත්කම් අත්පත් කර ගැනීමට අදාල ක්‍රමක්ෂය								(25,812,603)		(25,812,603)
*පෙර වත්කම් අත්පත් කර ගැනීමට අදාල ක්‍රමක්ෂය	(5,278,150)	(26,227,493)	(46,261,236)	(794,810)	(1,452,279)	(9,960)		(162,864,473)		(242,888,401)
*රඳවා ගත් ඉපැයුම්									(14,171,719)	(14,171,719)
2020 ජන. මස 01 වන දිනට ශේෂය	**1,395,670,711**	**419,382,796**	**423,448,676**	**-**	**1,552,026**	**15,623,160**	**396,411**	**2,539,170,404**	**165,504,208**	**4,583,394,240**
2020 හිමිකම් වෙනස්වීම										
* ප්‍රාග්ධන දීමනා 2020								255,000,000		
*ප්‍රාග්ධන ප්‍රදානය -වියදම් කළ								(7,518,127)		
*වර්ෂය තුළ දායකත්වය								247,481,873		247,481,873
*අතිරික්තය / (හිඟය)									45,556,263	45,556,263
*වසර තුළ වත්කම් අත්පත් කර ගැනීමට අදාල ක්‍රමක්ෂය								(23,045,544)		(23,045,544)
*පෙර වත්කම් අත්පත් කර ගැනීමට අදාල ක්‍රමක්ෂය	(5,278,150)	(26,227,492)	(42,344,868)		(962,540)	(3,110,688)		(181,233,863)		(259,157,601)
*පෙර ගැලපුම්	10,218,211									10,218,211
2020 දෙසැම්. 31 දිනට ශේෂය	**1,400,610,772**	**393,155,304**	**381,103,809**	**-**	**589,486**	**12,512,472**	**396,411**	**2,990,931,684**	**211,060,471**	**4,604,447,442**

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සඳහා වූ සටහන්

01. විවිධ ආදායම්

(i) ආයතනික ආදායම

විස්තරය	2020 (රු.)	2019 (රු.)
පාඨමාලා ගාස්තු	25,585,220	64,270,050
ගාස්තු අයකරන පාඨමාලා ගාස්තුව	-	1,764,000
ශිෂ්‍ය අයදුම්පත් ගාස්තු	14,000,500	16,853,300
විභාග ගාස්තු	3,502,550	12,251,320
යාවත්කාලීන කිරීමේ ගාස්තු	1,132,100	3,289,845
ඩිප්ලෝමා ප්‍රදාන අතිරික්තය	-	3,566,251
ගොවිපල අතිරික්තය	551,718	371,035
එකතුව	**45,772,088**	**102,365,801**

(ii) වෙනත් ආදායම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
ශාලා / උපකරණ කුලියට ගැනීම්	230,240	
පැරණි පුවත්පත් විකිණීම හා වෙන්දේසි	220,000	181,217
ණය පොළි	1,147,372	1,379,513
පොළි - භාණ්ඩාගාර බිල්පත්	9,778,642	11,697,030
පොළි - ඉතිරි කිරීම	2,479,852	5,263,632
පොළි - ස්ථාවර තැන්පත්	17,962,806	12,990,381
කුලී ගෙවීම්	1,828,831	1,743,547
දඩ අයකිරීම්	1,179,012	2,990,087
නේවාසිකාගාර ගාස්තු	639,000	3,245,500
ඡායා පිටපත් ගාස්තු	100,935	407,030
විවිධ	1,292,665	2,448,272
ආපසු නොගෙවන තැන්පත්	1,399,350	894,150
ඉවත් කළ වත්කම්	1,130,000	42,742
සූර්ය පැනල	1,039,776	-
විලම්භිත ආදායම්	465,838,136	570,329,747
එකතුව	**506,266,616**	**614,233,719**

2. සේවක පාරිශ්‍රමික

විස්තරය	2020 (රු.)	2019 (රු.)
වැටුප් හා කුලී		
(i) අධ්‍යයන	339,328,512	295,882,476
(ii) අනධ්‍යයන	222,637,230	191,246,562
බාහිර කථිකාචාර්ය ගාස්තු	36,053,889	71,850,024
පාරිතෝෂික	20,755,351	17,928,137
දීමනා - පාලක සභා සාමාජිකයන් සඳහා	132,000	246,000
දීමනා - අභ්‍යාසලාභීන්	1,488,604	3,706,157
දීමනා - අධ්‍යයන දීමනාව/ශාස්ත්‍රීය කමිටු/ කළමනාකරණ	-	5,800
දීමනා - විගණන හා කළමනාකරණ කමිටුව	-	32,400
කම්කරු ගාස්තු	161,800	427,270
සේවක අර්ථසාධක අරමුදල	71,640,807	64,146,161
සේවක භාරකාර අරමුදල	14,328,161	12,829,232
අතිකාල හා නිවාඩු දිනයන්හි ගෙවීම්	2,844,031	6,135,436
අග්‍රහාර රක්ෂණය	1,412,800	
උපදේශන /පරිවර්තන /සම්මුඛ පරීක්ෂණ මණ්ඩල	1,626,819	2,374,918
එකතුව	**712,410,004**	**666,810,573**

3. ගමන් වියදම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
දේශීය	1,652,646	3,574,676
විදේශීය	-	67,532
එකතුව	**1,652,646**	**3,642,208**

4. කොන්ත්‍රාත්මය සේවා

විස්තරය	2020 (රු.)	2019 (රු.)
කුලී හා ගාස්තු	10,967,655	12,622,754
පළාත් පාලන ආයතනයට ගාස්තු සහ බදු	381,899	540,223
විදුලිබලය	13,068,539	25,320,205
ජලය	5,218,804	10,538,313
විදුලි සංදේශ / අන්තර්ජාලය	38,205,052	31,809,925
තැපැල් ගාස්තු	442,070	1,863,882
සනීපාරක්ෂක පහසුකම්	46,936,798	47,716,432
බලපත්‍ර සහ රක්ෂණ	1,222,943	1,415,187
මුද්‍රණය / ප්‍රචාරණය	2,684,783	6,281,455
ආරක්ෂක සේවා	53,761,549	64,016,814
එකතුව	**172,890,092**	**202,125,188**

5. සැපයුම් හා අවශ්‍යතා

විස්තරය	2020 (රු.)	2019 (රු.)
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	6,519,218	8,876,422
ඉන්ධන සහ ලිහිසි තෙල්	1,971,399	2,385,099
නිල ඇඳුම්	260,000	228,000
විනෝදාස්වාදය	961,519	2,633,437
පුස්තකාල සේවා	587,438	1,106,682
ආපනශාලා සඳහා ගෑස්	142,714	438,055
එකතුව	**10,442,288**	**15,667,696**

6. නඩත්තු වියදම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
වාහන	1,505,687	2,605,619
පිරියත, යන්ත්‍රෝපකරණ	6,722,773	10,785,481
ගොඩනැගිලි සහ ව්‍යුහ	2,106,172	3,077,608
එකතුව	**10,334,631**	**16,468,708**

7. පුහුණු කිරීම සහ ඇගයීම

විස්තරය	2020 (රු.)	2019 (රු.)
රැස්වීම් / ශිෂ්‍ය සම්මුඛ පරීක්ෂණ/ අධ්‍යයන ගැටළු	4,700,378	5,422,269
උත්සව/ප්‍රදර්ශන/ශිෂ්‍ය සුබසාධන	574,522	1,215,687
විභාග / ඇගයුම්	17,084,145	45,204,528
වැඩමුළු/ සම්මන්ත්‍රණ	348,049	211,780
අධ්‍යයන චාරිකා / ක්ෂේත්‍ර සංචාර	731,870	2,829,227
කාර්ය මණ්ඩල පුහුණුව	79,200	1,428,617
ශිෂ්‍ය වාර ප්‍රවේශපත්	6,207,301	19,214,945
විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය	549,542	7,021,512
පුහුණුව සඳහා අවශ්‍ය දෑ	263,196	1,025,545
පාඨමාලා ප්‍රවර්ධන	298,775	495,561
ආයතනික සාමාජික ගාස්තු	6,750	53,750
එකතුව	**30,843,728**	**84,123,420**

8. වෙනත් වියදම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
නෛතික/ පරීක්ෂණ / යතුරු ලියන	204,500	452,200
විගණන ගාස්තු	1,150,000	1,150,000
බැංකු ගාස්තු	2,416	1,500
එකතුව	**1,356,916**	**1,603,700**

9. දේපල, පිරියත හා උපකරණ

විස්තරය	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්	ගොඩනැගිලි හා තැනීම්	රථ වාහන	ලී බඩු හා කාර්යාල උපකරණ	පරිගණක / යන්ත්‍ර	පුස්තකාල පොත්	වැඩමුළු හා පුහුණු උපකරණ	එකතුව
පිරිවැය								
2020.01.01 දිනට ශේෂය	677,640,205	4,716,347,579	119,888,451	2,544,593,977	657,916,369	80,483,608	169,612,207	8,966,482,396
වසරේ එකතුවීම්	4,565,403	639,760,782		42,480,665	6,318,843	13,040	5,967,431	699,106,164
ඉවත් කිරීම්/ගැලපීම්					(10,055,870)	(230,650)		(10,286,520)
2020.12.31 දිනට ශේෂය	682,205,608	5,356,108,361	119,888,451	2,587,074,642	654,179,342	80,265,998	175,579,638	9,655,302,040
ක්ෂය								
2020.01.01 දිනට ශේෂය	4,457,578	1,443,533,602	106,004,191	2,188,155,794	557,552,321	34,142,987	106,351,897	4,440,198,370
වසරේ ක්ෂය ගාස්තු	1,546,707	250,763,389	1,613,122	158,461,638	39,084,406	3,825,270	10,264,162	465,558,694
ගැලපීම්					(10,055,870)	(230,650)		(10,286,520)
2020.12.31 දිනට ශේෂය	6,004,285	1,694,296,991	107,617,313	2,346,617,432	586,580,857	37,737,607	116,616,059	4,895,470,544
ධාරණ අගයන්								
2020.01.01 දිනට ශේෂය	676,201,323	3,661,811,370	12,271,138	240,457,210	67,598,484	42,528,391	58,963,578	4,759,831,495
නොනිමි ඉදිකිරීම් 9 (අ)	-	423,699,824			-	-	-	423,699,824
2020.12.31 දිනට ශේෂය	676,201,323	4,085,347,650	12,271,138	240,457,210	67,598,484	42,528,391	58,963,578	**5,183,531,319**

9 (අ) නොනිමි ඉදිකිරීම්

විස්තරය	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්	ගොඩනැගිලි හා තැනීම්	රථ වාහන	ලී බඩු හා කාර්යාල උපකරණ	පරිගණක / යන්ත්‍ර	පුස්තකාල පොත්	වැඩමුළු හා පුහුණු උපකරණ	එකතුව
2020.01.01 දිනට ශේෂය		843,198,502	-	-	-	-	-	843,198,502
අදාල ගිණුම්වලට මාරු කරන ලදී		(596,945,827)						(596,945,827)
වර්ෂය තුළ දරන ලද		177,447,149						177,447,149
2020.12.31 දිනට ශේෂය		423,699,824	-	-	-	-	-	423,699,824

10. ආයෝජන

විස්තරය	2020 (රු.)	2019 (රු.)
භාණ්ඩාගාර බිල්පත් - ශ්‍රී ලං. ඵ. තා. අ. ආ.	6,014,210	5,901,425
භාණ්ඩාගාර බිල්පත් - ශ්‍රී ලං. ඵ. තා. අ. ආ.	134,875,000	126,915,352
ස්ථාවර තැන්පතු - ශ්‍රී ලං. ඵ. තා. අ. ආ.	111,543,764	107,057,534
ස්ථාවර තැන්පතු - ගම්පහ ඵ. තා. ආ.	1,321,550	1,213,458
ස්ථාවර තැන්පතු - යාපනය ඵ. තා. ආ.	2,317,094	2,133,304
එකතුව	**256,071,618**	**243,221,073**

11. අස්පෘශ්‍ය වත්කම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
ශක්‍යතා ගොඩනැගීම	22,578,127	24,195,855
ගිණුම්කරණ පැකේජ	728,865	1,008,307
එකතුව	**23,306,992**	**25,204,162**

12. තැන්පතු, පෙර ගෙවුම්, අත්තිකාරම් සහ ණය ගැනියන්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
තැන්පත්	2,516,250	2,516,250
පූර්ව ගෙවීම්	883,201	1,151,727
වෙනත් අත්තිකාරම්	864,963	459,963
වැඩ ඇරඹීමේ අත්තිකාරම්	46,793,421	71,559,883
උත්සව අත්තිකාරම්	13,750	17,500
ණයගැතියෝ	1,084,055	1,214,176
පොලී ආදායම්- ආයෝජන	7,988,116	-
ආපදා ණය	30,788,486	33,309,224
විශේෂ අත්තිකාරම්	800	21,200
ස්වභාවික ආපදා ණය	-	168,655
වෙනත් ලැබීමට නියමිත දෑ	51,351	2,500
එකතුව	**90,984,394**	**110,421,078**

13. කෙටිකාලීන ආයෝජන

විස්තරය	2020 (රු.)	2019 (රු.)
කෙටිකාලීන ස්ථාවර තැන්පතු - ශ්‍රී ලං. ඵ. තා. අ. ආ.	56,058,693	52,683,232
කෙටිකාලීන ස්ථාවර තැන්පතු - ශ්‍රී ලං. ඵ. තා. අ. ආ.	56,058,693	52,683,232
එකතුව	**112,117,386**	**105,366,464**

14. මුදල් හා මුදල් සමාන දෑ

ආයතනය		2020 (රු.)	2019 (රු.)
ප්‍රධාන කාර්යාලය	- ජංගම ගිණුම	37,809,155	8,603,475
	- ඉතුරුම් ගිණුම	56,779,489	60,504,128
	- ආපදා ණය ගිණුම	6,760,719	3,115,358
	- අතැති මුදල්		498
අම්පාර	- ජංගම ගිණුම	600,160	541,037
	- ගොවිපල ගිණුම	1,589,832	1,266,310
අනුරාධපුරය	- ජංගම ගිණුම	949,811	-
බදුල්ල	- ජංගම ගිණුම	1,966,659	4,585,595
මඩකලපුව	- ජංගම ගිණුම	826,127	-
කොළඹ	- ජංගම ගිණුම	12,213,688	4,865,750
දෙහිවල	- ජංගම ගිණුම	3,591,830	858,072
ගාල්ල	- ජංගම ගිණුම	1,554,430	1,712,133
	- ගොවිපල ගිණුම	154,461	147,696
ගම්පහ	- ජංගම ගිණුම	7,395,986	855,985
	- ගොවිපල ගිණුම	290,335	358,434
	- අතැති මුදල්	500	-
යාපනය	- ජංගම ගිණුම	190,985	219,919
මහනුවර	- ජංගම ගිණුම	1,029,114	3,814,501
කෑගල්ල	- ජංගම ගිණුම	4,036,108	793,304
කුරුණෑගල	- ජංගම ගිණුම	1,687,368	4,216,035
රත්නපුරය	- ජංගම ගිණුම	705,942	-
සමන්තුරේ	- ජංගම ගිණුම	1,244,559	-
ත්‍රිකුණාමලය	- ජංගම ගිණුම	583,371	406,893
එකතුව		**141,960,630**	**96,865,123**

15. පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන

විස්තරය	2020 (රු.)	2019 (රු.)
2020.01.01 දිනට ශේෂය	154,346,042	141,902,183
වර්ෂය සඳහා ප්‍රතිපාදන	20,755,351	17,928,137
	175,101,393	159,830,320
<u>අඩු කළා:</u>		
වසරේ ගෙවීම්	(2,908,281)	(5,484,278)
2020.12.31 දිනට ශේෂය	**172,193,112**	**154,346,042**

16. ණයහිමියන්

ණය හිමියන්	2020 (රු.)
අභිශාන් කන්ස්ට්‍රක්ෂන්	2,121,476
අභිරු කන්ස්ට්‍රක්ෂන්	218,287
ඇඩ්වාන්ස් ඩිවෙලොපර්ස්	166,872
ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස්	7,749
ඇරම්ජී ගෘප්	899,451
ඒ වී ජී බිල්ඩර්ස්	656,733
බීටා ඉංජිනියර්ස්	3,271,085
බොබී කන්ස්ට්‍රක්ෂන්	210,992
සෙන්ට්‍රල් සප්ලයර්ස් ප්‍රයිවට් ලිමිටඩ්	7,004,202
චාමිකර ඉංජිනියර්ස්	23,101
ඩෙවෝකෝ ආකිටෙක්ස්	5,256,628
ධම්මික කන්ස්ට්‍රක්ෂන්ස්	50,200
ඩ්‍රීම් බිල්ඩ් කන්ස්ට්‍රක්ෂන්	223,172
ඉලෙක්ට්‍රෝ මෙටිල් ප්‍රෙසිං ප්‍රයිවට් ලිමිටඩ්	35,315,755
ෆෝකස් මාකටිං ඇන්ඩ් ඉංජිනියරින්	12,956,179
අයිඩියල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් වර්ක්	137,468
ජේ. ලංකා ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ්	923,754
කැන්ඩි කන්ස්ට්‍රක්ෂන්ස්	528,500
කැන්ඩියන් ට්‍රැවලර්ස්	12,955,521
කේ එම් එස් ටී	169,900
ලංකා කන්ස්ට්‍රක්ෂන්	135,879
ලින්කෝ ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්	7,047,602
මෙට්‍රොපොලිටන් ඔෆිස්	594,000
එන් සී ක්‍රියේටිව්	9,314
නිව් කීර්ති හාඩ්වෙයාර්	7,225
ඔකඳ කන්ට්‍රැක්ටර්ස්	14,997,962
රියෝ ලංකා සර්විසස්	2,185,000
රෝහිත කන්ස්ට්‍රක්ෂන්ස්	456,164
සවිජය රෝඩ් කන්ස්ට්‍රක්ෂන්	17,752
ශිල්මියා කන්ස්ට්‍රක්ෂන්	358,641
සිරිධාන්ත කන්ස්ට්‍රක්ෂන්	6,260,348
සිවශක්ති කන්ස්ට්‍රක්ෂන්	196,081
එස් එම් ෆර්නිචස්	7,981,000
එස් එස් කන්ස්ට්‍රක්ෂන්	136,391
ස්ටේට් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කෝපරේෂන්	14,050,098
ස්ටේට් ඉංජිනියරින් කෝපරේෂන්	34,601,247
සුරත් ඉලෙක්ට්‍රිකල්ස්	8,467

ණය හිමියන්	2020 (රු.)
සන්පවර් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ්	19,520,540
සිංගර් ශ්‍රී ලංකා පී එල් සී	157,500
ටාස්ක් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්	283,395
ඌව කොමර්ෂල් ඉන්ජිනියරින්ග් ප්‍රයිවට් ලිමිටඩ්	385,807
වින්සෙන් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්	2,556,000
වික්‍රමසිංහ බිල්ඩර්ස්	444,189
විජේසිංහ කන්ස්ට්‍රක්ෂන්	242,041
විජිටෙල් කන්ස්ට්‍රක්ෂන්	165,742
යන්සික කන්ස්ට්‍රක්ෂන්	564,015
උ. තා. ආ. දෙහිවල - ගිම්හාන් ෆර්නිචර්- රඳවා තබා ගැනීම- නේවාසිකාගාර කියවීමේ පුටු	107,340
උ. තා. ආ. අම්පාර- ගොඩනැගිලි පුනරුත්ථාපනය	412,403
උ. තා. ආ. බදුල්ල- ඉඩම් පුනරුත්ථාපනය	1,854,858
උ. තා. ආ. කුරුණෑගල - ඉඩම් සංවර්ධනය	858,483
උ. තා. ආ. කුරුණෑගල- ක්‍රවුන් ඉන්වෙස්මන්ට්- ඡායා පිටපත්	43,172
උ. තා. ආ. ගාල්ල- අල්කොබ්‍රොන්ස්- වැඩමුළු උපකරණ	4,940,400
උ. තා. ආ. ත්‍රිකුණාමලය- ගොඩනැගිලි පුනරුත්ථාපනය	3,102,169
එකතුව	**207,778,247**

17. උපචිත වියදම්

විස්තරය	2020 (රු.)	2019 (රු.)
ප්‍රධාන කාර්යයාලය	34,110,194	51,284,320
අම්පාර	6,586,834	8,297,557
අනුරාධපුරය	1,787,601	-
බදුල්ල	4,159,877	3,381,908
මඩකලපුව	3,714,848	-
කොළඹ	9,914,761	4,079,180
දෙහිවල	5,308,480	6,041,404
ගාල්ල	5,603,743	7,037,278
ගම්පහ	4,421,256	4,400,019
යාපනය	4,151,106	1,335,500
මහනුවර	1,711,376	3,722,731
කෑගල්ල	1,270,050	1,183,378
කුරුණෑගල	1,847,239	5,431,703
රත්නපුරය	2,529,559	-
සමන්තුරේ	3,915,170	-
ත්‍රිකුණාමලය	1,283,682	5,430,448
එකතුව	**92,315,776**	**101,625,427**

18. ගෙවිය යුතු තැන්පතු

විස්තරය	2020 (රු.)	2019 (රු.)
පුස්තකාල/ වෙනත් තැන්පතු	22,299,835	22,305,362
ටෙන්ඩර්/ ආපසු ගෙවිය හැකිය	3,168,052	3,276,552
මහපොල	8,450,000	10,205,000
ඉල්ලුම් නොකළ ගෙවිය යුතු - විවිධ.	6,185,824	6,437,872
ගෙවිය යුතු සෘජු හා වක්‍ර බදු	82,757	83,057
එකතුව	**40,186,467**	**42,307,842**

අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය, ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇති අතර, එමගින් ප්‍රධාන කාර්යාලයේ හා උසස් තාක්ෂණ ආයතනයන්හි විගණනය හා සම්බන්ධ සියලු කාර්යභාරයන් ඉටු කරනු ලබයි. එහිදී, දැනට තිබෙන අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම, නව පාලන පද්ධති හඳුන්වා දීම, චක්‍රලේඛ ප්‍රකාර ව ආයතන ක්‍රියාවලි ඇගයීම, නීති රෙගුලාසි ප්‍රතිපත්තිවල අනුකූලතාවය තක්සේරු කිරීම හා නියාමනය කිරීම, දුර්වල පාලනයන් හඳුනා ගැනීම හා පාලනය, ඒ අනුව අවශ්‍ය පිළියම් යෙදීම අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය වේ.

2020 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද කාර්ය භාරය.

- කාර්ය සාධන විගණනයට අදාළ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදීම (උසස් අධ්‍යාපන අංශය).
- වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2019 ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත අදාළ තොරතුරු සපයන ලදී.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ රැස්වීම් වලට අදාළ කාර්තුමය වාර්තා සකස් කිරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විගණන විමසුම්වලට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම.
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව සඳහා විගණන අංශයේ තොරතුරු ඉදිරිපත් කිරීම.
- 2019 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ ව ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණන වාර්තාවට පිළිතුරු සකස් කිරීම.

2020 මූල්‍ය වර්ෂයේ දී, නව නිලධාරී මණ්ඩලයක් පත් නොවීම නිසා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්විණි. තව ද මෑතක දී, රට තුල ව්‍යාප්තව පැවති කොවිඩ් 19 වසංගතය ද මේ සඳහා හේතුවක් විය. කෙසේ වෙතත්, අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය, විවිධ කාලවලදී අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා පැවැත්වීය. එම රැස්වීම්වලට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සහ ක්‍රියාමාර්ග ඵලදායීතාව ලෙස ක්‍රියාත්මක කර ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලං. ඌ. තා. අ. ආ. හි මූල්‍ය හා පරිපාලන, අධ්‍යයන, විභාග, ඉංජිනේරු සහ වෙනත් අංශ පිළිබඳ පූර්ණ පරිමාණ විගණනයක් සිදු කර ඇති අතර 'සුදුසුකම් ලත් මතයක්' ලබා දී ඇත.

විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/SLIATE/FA/2020 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021 ඔක්තෝබර් 27

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කරනු ලැබේ. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් සිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකරීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක තරය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකපිළිසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාහජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම සිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිසෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අභ්‍යන්තය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක්

ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අවණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වපුභාව හා අන්තර්ගතය සඳහා පදනම් වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණවත්මත කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරුණු කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනයට සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් යෙදුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙතන් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කාර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනය කර ගැනීමා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන වාහපෘතිය යටතේ රු. මිලියන 512 ක ඇස්තමේන්තුවක් මත දෙණිවල උසස් තාක්ෂණ ආයතනයේ මහල් 5 කින් යුත් තායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිම කිරීමට නියමිතව තිබුණද රු.මිලියන 113.8 ක් වැයකර මහල් 3 ක් පමණක් නිමකර 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාර දී තිබුණි. ඉතිරි මහල් දෙකේ වැඩ නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල විගනිත දිනය වූ 2021 සැප්තැම්බර් 30 දක්වාම නිශ්කාර්යව පැවති අතර එම ගොඩනැගිල්ලේ සවි කර ඇති උපකරණ වල වගකීම් කාලය ද ඉකුත් වී ගොස් තිබුණි.

(ආ) දෙණිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විදුලි වියදම් අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතියක් සවිකිරීමේ මූලික කාර්යය නිම කිරීම වෙනුවෙන් රු.19,784,000 ක් 2019 ජූනි 07 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට 2021 සැප්තැම්බර් 30 දක්වාම අපොහොසත් වී තිබීම හේතුවෙන් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. 2019 ජූනි සිට 2020 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ආයතනය විදුලි වියදම් වෙනුවෙන් රු.2,510,435 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.

(ඇ) දියත්තිස්ස 9 ක ගොඩනැගිලි ඉදිකර උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල නීතියානුකූල අයිතිය ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා ලියාපදිංචි නොවූ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු ලවා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ උසස් තාක්ෂණ ආයතන 08 කට අදාළව ඉටුකරගෙන තිබූ කොන්ත්‍රාත් වෙනුවෙන් රු.6,987,493 ක් එකතු කළ අගය මත බදු (VAT) ලෙස ඔහු වෙත ගෙවා තිබුණි. එසේ ගෙවා තිබූ මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ආයතන හා ආයතනික අංශ 17 කට අදාළව එකතුව රු.මිලියන 135.6 ක් වූ ප්‍රසම්පාදන කාර්යන් 51 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණද වර්ෂ අවසානය දක්වාම කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

ඩබ්ලිව්.ඒ.සී. වික්‍රමරත්න

විගණකාධිපති

2.3	**වෙනත් විගණන නිරීක්ෂණ**	
	(අ) 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 512 ක ඇස්තමේන්තුවක් මත දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකර ඇති නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ නිම කිරීමට නියමිතව තිබූ මහල් 5 න් මහල් 3 ක් පමණක් රු. මිලියන 113.8 ක වියදමින් නිමකර 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාරදී තිබුණද ඉතිරි මහල් දෙකේ වැඩ නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල වාර්තාවේ දින දක්වා නිශ්කාර්යව පැවතුණි. එසේම එම ගොඩනැගිල්ලේ ඇතුලත හා පිටත සවිකර ඇති උපකරණ ප්‍රයෝජනයට නොගෙන වගකීම් කාලය නිකුත් වී ගොස් තිබුණි.	මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර දෙකකින් සමන්විතය. ගොඩනැගිල්ලේ මුල් අදියර ලෙස ප්‍රථම මහල් තුන සමන්විත අතර, දෙවන මහල් සහ දෙවන අදියරට අන්තර්ගතය. එමෙන්ම එක් අදියරක් අවසාන වනවාත් සමගම දෙවන අදියර ආරම්භ කළ යුතුව තිබිණි. අදියර එක හා දෙක එකිනෙකින් වෙන්වූ ස්වාධීන ව්‍යාපෘති ලෙස සිදු කළ යුතුව තිබුණි. මෙහි මුල් අදියර කොන්ත්‍රාත්කරු විසින් සාර්ථකව අවසාන කොට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත භාරදී ඇත. නමුත් යෝජිත ව්‍යාපෘතිය භාවිතයට ගැනීමට නම් ව්‍යාපෘතියේ දෙවෙනි අදියර අවසාන කළ යුතුව තිබුණි. මන්දයත් මෙහි මුල් මහල් තුනට අදාල ඇතැම් කටයුතු සෙසු මහල් 05 ඉදිකිරීමේදී සිදු කළ යුතුව තිබුණි. බාහිර බිත්ති තෙත් නිරාවරණය කිරීම, බාහිර බිත්තිවල තීන්ත ආලේප කිරීම, විදුලි සෝපාන විවරය ආවරණය කිරීම හා විදුලි සෝපානය සවි කිරීම, අභ්‍යන්තර පියගැට පෙල ඉදිරියට කරගෙන යාම හා ඒ හරහා ගොඩනැගිල්ල අභ්‍යන්තරයට ජලය ගලා ඒම වැළැක්වීම උදාහරණ ලෙස දැක්විය හැක. තවද ඉහළ මහල්වල ඉදිකිරීම් සිදුවන විට පහත මහල් භාවිතයට ගැනීමේදී පහත මහල්වල පදිංචිකරුවන්ට අනාරක්ෂිත වීම නිසාත්, ඉහළ මහල්වල ඉදිකිරීම් සිදුකර ගෙන යාමට බාධා සිදුවිය හැකි නිසාත් මෙම සමස්ත ඉදිකිරීම් අවසානය වන තෙක් භාවිතයට ගැනීම දුෂ්කර වී ඇත. දෙවන අදියර අදාළ ප්‍රසම්පාදන කටයුතු

		අවසාන කොට කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කිරීමට උචිත මට්ටම දක්වා අදාල කටයුතු ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් සිදුකොට ඇත. නමුත් අදාළ දෙවන අදියර සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය මගින් අනුමත නොවීම නිසා ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. මෙවැනි අවස්ථාවක් තුළ ගොඩනැගිල්ලේ අන්තර්ගත උපාංග භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙම ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අදාල ප්‍රතිපාදන නැවත ඉල්ලීම් කරන ලෙස දැනුම් දී ඇති අතර, මෙම මහල් අටකින් සමන්විත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ලබාදෙන මෙන් ඉල්ලීමක් සිදුකොට ඇති බව ද දන්වමි. මෙම ව්‍යාපෘතිය අදියර (1) හි අන්තර්ගත මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලේ පහත මාලය (Basement Floor) වාහන නැවැත්වීම සඳහා නිර්මාණය කොට ඇති අතර, සෙසු මහල් දෙක සමස්ත ප්‍රධාන කාර්යාල පරිශ්‍රයම ස්ථානගත කිරීම සඳහා ප්‍රමාණවත් තත්ත්වයක නොපවතින බව පෙනී ගොස් ඇත. තව ද යෝජිත ව්‍යාපෘතිය භාවිතයට ගැනීමට නම් ව්‍යාපෘතියේ දෙවන අදියර අවසාන කළ යුතුව තිබුණි. මන්දයත් මෙහි මුල් මහල් තුනට අදාළ ඇතැම් කටයුතු සෙසු මහල් පහ ඉදිකිරීමේ දී සිසු කළ යුතුව තිබුණි. බාහිර බිත්ති තෙත් නිවාරණය කිරීම, බාහිර බිත්තිවල තීන්ත ආලේප කිරීම, විදුලි සෝපාන විවරය ආවරණය කිරීම හා විදුලි

		සෝපානය සවි කිරීම, අභ්‍යන්තර පිය ගැට පෙළ ඉදිරියට කරගෙන යාම හා ඒ හරහා ගොඩනැගිල්ල අභ්‍යන්තරයට ජලය ගලා ඒම වැළැක්වීම උදාහරණ ලෙස දැක්විය හැක. ආසන්න අමතර ප්‍රතිපාදන අවශ්‍ය ව ඇත.
	(ආ) දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විදුලි වියදම් අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතියක් සවිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව පද්ධතිය සවිකිරීමට අදාළ මූලික කාර්ය නිම කිරීම වෙනුවෙන් රු.19,784,000 ක මුදලක් 2019 ජුනි 07 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එසේ වුව ද පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට වාර්තාවේ දින දක්වා ආයතනය අපොහොසත් වී තිබීම හේතුවෙන් 2019 ජුනි සිට 2020 දෙසැම්බර් දක්වා ආයතනයේ විදුලිය වෙනුවෙන් දරා ඇති රු. 2,510,435 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.	මෙම විගණන විමසුමට අදාල තොරතුරු ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඉංජිනේරු අංශය මගින් පවත්වා ගනු ලබන අදාළ ව්‍යාපෘතිය සම්බන්ධ ලිපිගොනුව පරීක්ෂා කිරීම තුළින් එම දත්ත මත අදාළ ව්‍යාපෘතිය සමග මේ හා සමාන තවත් ව්‍යාපෘති 04 ක් මීට සමගාමීව ක්‍රියාවට නැංවිනි. ගාල්ල, මහනුවර, අම්පාර, ගම්පහ හා දෙහිවල උසස් තාක්ෂණ ආයතන ආශ්‍රිතව මෙම ව්‍යාපෘති 05 ක්‍රියාත්මක විය. මහනුවර, අම්පාර හා ගාල්ල උසස් තාක්ෂණ ආයතනවල සූර්ය බලශක්ති පද්ධති මේ වන විට සාර්ථක ව ක්‍රියාකාරී තත්ත්වයේ පවතී.
	(ඇ) දිස්තික්ක 9 ගොඩනැගිලි ඉදි කර උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්යෙන් දැනටමත් නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සම්බන්ධ ව අවශ්‍ය පියවර ගෙන ඇති අතර එම කටයුතු ක්‍රියාත්මක මට්ටමේ පවතී.
	ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි නොවූ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු ලවා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ ඇති ආයතන 8 කට අදාළව ඉටුකර ගෙන තිබූ කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් රු. 6,987,493 එකතු කළ	ඔබ සඳහන් කර ඇති විගණන විමසුම සම්බන්ධව 2021.04.01 දින අධ්‍යාපන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති විගණන කමිටු රැස්වීමේ දී අවධානයට ලක්විය. කමිටුවේ තීරණය වුයේ, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත එකතු කළ අගය මත (Vat) බදු ගෙවිය යුතු රු. 13,026,074.50 ක සම්පූර්ණ මුදල ගෙවූ පසු එම

	අගය මත බදු (VAT) ලෙස ඔහු වෙත ගෙවා තිබුණි. එසේ ගෙවා තිබූ මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති මුදල සඳහන් කරන ලෙසය. කෙසේ වෙතත් මේ වන විට අදාළ කොන්ත්‍රාත්කරු එකතුකල අගය මත (Vat) බදු මුදල රු. 6,038,581.36 ක මුදලක් ගෙවා නිදහස් කර ඇති බව කාරුණික ව දැනුම් දෙමි. තවදුරටත් ගෙවිය යුතු රු. 6,987,493.14 ක (Vat) බදු මුදල ද දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා සඳහන් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇත.
	(ඌ) සමාලෝචිත වර්ෂය තුළ උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඇතුලු ආයතන හා ආයතනික අංශ 17 කට අදාළව එකතුව රු.මිලියන 135,611 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 47 ක් ඉටුකිරීමට සැලසුම්කර තිබුණද වර්ෂ අවසානය දක්වා අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි.	රට තුළ පැවති වසංගත තත්ත්වය නිසා සැප්තැම්බර් - දෙසැම්බර් දක්වා කාලය තුළ කිරීමට අපේක්ෂා කළ ප්‍රසම්පාදන සැලැස්ම සම්පූර්ණ කිරීමට නොහැකි විය. නමුත් අයිතම කිහිපයක් හැර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

තිරසාර සංවර්ධනය පිළිබඳ වාර්තාව

තිරසාර සංවර්ධන අභිමතාර්ථ

සියලු එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් එක් ව 2030 තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය 2015 දී සම්මත කරන ලදී. එය පුද්ගලයන්ට සහ පෘථිවියට සාමය සහ සමෘද්ධිය සඳහා හවුල් සැලැස්මක් සපයයි. දරිද්‍රතාවය, අසමානතාවය, දේශගුණික විපර්යාස, පාරිසරික හායනය, සාමය සහ යුක්තිය ඇතුළු ගෝලීය අභියෝග රැසකට ඔවුහු මුහුණ පා සිටිති. 2030 වන විට සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත එකිනෙක හා සම්බන්ධ ඉලක්ක 17ක් මේ අතර වේ.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ඉලක්කය 4: පුළුල් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

ගෝලීය ඉලක්ක:

4.3 2030 වන විට, සියලු කාන්තාවන්ට සහ පිරිමින්ට දැරිය හැකි සහ ගුණාත්මක තාක්ෂණික වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

4.5 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් ඇතුළු අවදානමට ලක් වූවන් සඳහා සියලු මට්ටමේ අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

4.7 2030 වන විට, අධ්‍යාපනය සහ තිරසාර ජීවන රටාව තුළින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අධ්‍යයනය කරන්නන්ට ලබා දීම සහතික කිරීම.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, තිරසාර සංවර්ධන ඉලක්ක සමග යන ඍජු ගමන් මග

ඉලක්කය 1 - උසස් තාක්ෂණික අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අවස්ථා වැඩි කිරීම
ඉලක්කය 2 - ඩිප්ලෝමාධාරීන්ගේ ගුණාත්මකභාවය, සේවා නියුක්තිය සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම

2020 දී තිරසාර සංවර්ධන ඉලක්කය 4 (ශ්‍රී ලං.උ. තා. අ. ආ. ඉලක්කය 1 සහ 2) හි ප්‍රගතිය

අ. ඉලක්ක 4.3 සහ තිරසාර සංවර්ධන ඉලක්කවලින් 4.5 ආවරණය වන ලෙස උසස් තාක්ෂණික අධ්‍යාපනයට ප්‍රවේශය සහ අවස්ථා වැඩි කිරීම.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොවිඩ්-19 සම්බන්ධයෙන් 2020 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර 2020 මාර්තු 11 වන දින කොවිඩ්-19 වසංගතයක් ලෙස ප්‍රකාශයට පත් කෙරුණි. වෛරසයට ගොදුරු වූ පළමු ශ්‍රී ලාංකිකයා 2020 මාර්තු 11 වන දින හඳුනා ගැනීමත් සමඟ ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ආයතන තුළ රෝගය පැතිරීම වැළැක්වීම සඳහා රට වසා දැමීමට කටයුතු කරන ලදී. මෙම තත්වයත් සමඟ 2020 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම කල් දමන ලද අතර බඳවා ගැනීම සඳහා අයදුම්පත්, මාර්ගගත ක්‍රමවේදයක් හරහා කැඳවීමට පියවර ගත් නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වයේ දෙවන රැල්ල හේතුවෙන් අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන් තෝරා ගැනීම 2021 වසර දක්වා කල් තබන ලදී.

ආ. ඩිප්ලෝමාධාරීන්ගේ ගුණාත්මකභාවය, සේවා නියුක්තිය සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම:

කාර්මික අවශ්‍යතා සපුරාලීම සහ සිසුන්ගේ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහනේ විෂයමාලාව සංශෝධනය කිරීම.

2021 සඳහා ඉලක්ක

- අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව මත පදනම් ව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, උපාධි ප්‍රදානය කරන ආයතනයකට උසස් කිරීම.
- යෝජිත උපාධි වැඩසටහන් සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම.
- වැඩි සිසුන් පිරිසක් බඳවා ගැනීම සඳහා යටිතල පහසුකම් පහසුකම් සංවර්ධනය කිරීම.